April 2026 theSocialist.lk ISSN 3093-6217

# The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | න්‍යාය | ඉතිහාසය| පන්ති අරගල

## සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් ගැඹුරු බෙදීම් මධ්‍යයේ, ඊශ්‍රායලය ලෙබනනයට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරයි

බාධක ලෙස ගැනෙන සමස්ත සමාජයන්ම යටත් කර ගැනීම සඳහා ඒවා සුන් කර දැමිය හැකි දේ ලෙස සලකන අපරාධකාරී කතිපයාධිකාරීත්වයක් විසින් එක්සත් ජනපදය මෙහෙයවනු ලබන බව ලෝකයට පෙන්වා දී ඇත. පි.8

## එක්සත් ජනපදය හෝමූස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීමෙන් ප්‍රධාන බලවතුන් අතර ගැටුම් ගැඹුරු වේ

ඉරාන ශිෂ්ටාචාරය අතුගා දැමීමට ට්‍රම්ප්ගේ ලේ කැටි ගැස්සෙන තර්ජන සාක්ෂි දරන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදය තමන්ගේ වියදමින් "බහුපාර්ශ්විකත්වයේ" ධජය යටතේ චීන සහ රුසියානු බලපෑම පුළුල් කිරීම සාමකාමීව පිළිගන්නේ නැති බවයි. පි.10

## ප්‍රමාද වැඩි වීමට පෙර අත්‍යාසන්න සමූහ ජනසංහාරය නවත්වනු! ඉරාන ශිෂ්ටාචාරය අතුගා දැමීමේ ට්‍රම්ප්ගේ තර්ජනය හෙළා දකිනු! SLLA ප්‍රකාශය පි.13

## කියුබාවට සහ ලතින් ඇමරිකාවට එරෙහි වොෂින්ටනයේ ප්‍රහාරය: 20 වන සියවස අහෝසි කිරීමේ ධනවාදී ධාවනයේ මුඛ්‍ය පෙරමුණක් පි.15

## මාර්තු 28 "රජවරු එපා" පෙළපාලි: දේශපාලන පාඩම්

මාර්තු 28 වන දින විරෝධතාවල පරිමාණය, රට තුළ ඒකාධිපතිත්වයේ වර්ධනය සහ විදේශයන්හි අධිරාජ්‍යවාදී යුද්ධයේ උත්සන්න වීම කෙරෙහි මහජන කෝපයේ ගැඹුර පිළිබිඹු කළේය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවලින් බිඳී යන ධනේශ්වර කතිපයාධිකාරය සහ ජනගහනයේ පුලුල් ජනතාව අතර ගැටුමක් දිග හැරෙමින් තිබේ. පි.19



# ට්‍රම්ප් හෝමූස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීම: ඉරාන යුද්ධයේ ඊළඟ අදියර

මෙම අවහිර කිරීම යුද ක්‍රියාවක් සහ ජාත්‍යන්තර මුහුදු කොල්ලකාරී ක්‍රියාවකි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඉරානයට සහ සමස්ත ලෝකයේ කම්කරු පන්තියට එරෙහිව එල්ල කරන ලද මෙම සාපරාධී ක්‍රියාව හෙළා දකී. ඉහළ යන බලශක්ති පිරිවැය, ආහාර හිඟය සහ නිරන්තරයෙන් පුළුල් වන මිලිටරි ගැටුමක අන්තරාය මගින් කම්කරු පන්තිය එහි මිල ගෙවනු ඇත. පි.2



## ඉරානය ඉලක්ක කරගත් හෝමූස් සමුද්‍ර සන්ධියේ ඇමරිකානු අවහිර කිරීමට එක්වීම යුරෝපීය රාජ්‍යයන් ප්‍රතික්ෂේප කරයි

ට්‍රම්ප් සමඟ ඔවුන්ගේ සහයෝගිතාවයට යටින් පවතින්නේ පුද්ගලික බියගුලුකම පමණක් නොව, සියල්ලටත් වඩා වෛෂයික අධිරාජ්‍යවාදී අවශ්‍යතා ය. යුරෝපීය බලවතුන් මැදිහත් වන්නේ තමන්ගේම හමුදා කඳවුරු සහ මැද පෙරදිගින් ලබාගත් ලාභ ආරක්ෂා කර ගැනීමට සහ වෝල් වීදිය හා මූල්‍ය සබඳතා මෙන්ම ඇමරිකානු අධිරාජ්‍යවාදය සමඟ ඔවුන්ගේ නේටෝ මිලිටරි සන්ධානය පවත්වා ගැනීමට ය. පි.5

# ට්‍රම්ප් හෝමූස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීම — ඉරාන යුද්ධයේ ඊළඟ අදියර

**ඇන්ඩ්‍රේ ඩේමන්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අප්‍රේල් *13* වන දින *"**[Trump's blockade of the Strait of Hormuz: The next phase in the Iran war]**"* යන හිසින් පළවූ ඇන්ඩෲ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

පකිස්ථාන අගමැති ෂෙබාස් ෂරීෆ් විසින් දින හයකට පෙර ප්‍රකාශයට පත් කරන ලද සටන් විරාමය, එක්සත් ජනපදය විසින් සඵල ලෙස අවලංගු කිරීම සනිටුහන් කරමින්,ඉරාන වරායන්ට ඇතුළු වන හෝ පිටවන සියලුම නැව් අවහිර කිරීම ආරම්භ කර ඇති බව එක්සත් ජනපද හමුදාව සඳුදා නිවේදනය කළේය. එය ඉරානයට එරෙහි එක්සත් ජනපද යුද්ධයේ ප්‍රධාන උත්සන්න වීමක් සලකුණු කරයි.

එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඉරිදා ඔහුගේ Truth Social වේදිකාවේ ප්‍රකාශ කළේ නාවික හමුදාව "හෝමූස් සමුද්‍ර සන්ධියට ඇතුළු වීමට හෝ පිටව යාමට උත්සාහ කරන ඕනෑම සහ සියලුම නැව් අවහිර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන" බවයි. සෙනසුරාදා, නියෙමු මිසයිල ඩිස්ට්‍රොයර් (guided-missile destroyers) යාත්‍රා දෙකක් සමුද්‍ර සන්ධියට ඇතුළු වූ අතර, වෝල් ස්ට්‍රීට් ජර්නලය වාර්තා කළේ අවහිරය බලාත්මක කිරීම සඳහා එක්සත් ජනපද යුද නැව් 15 ක් දැන් යොදවා ඇති බවයි.

මෙම අවහිර කිරීම යුද ක්‍රියාවක් සහ ජාත්‍යන්තර මුහුදු කොල්ලකාරී ක්‍රියාවකි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඉරානයට සහ සමස්ත ලෝකයේ කම්කරු පන්තියට එරෙහිව එල්ල කරන ලද මෙම සාපරාධී ක්‍රියාව හෙළා දකී. ඉහළ යන බලශක්ති පිරිවැය, ආහාර හිඟය සහ නිරන්තරයෙන් පුළුල් වන මිලිටරි ගැටුමක අන්තරාය මගින් කම්කරු පන්තිය එහි මිල ගෙවනු ඇත.

ට්‍රම්ප්ගේම වාක්‍ය ඛණ්ඩයම භාවිතා කරන්නේ නම්, සටන් විරාමය යුද්ධයේ ඊළඟ අදියර සඳහා "උණ්ඩ නැවත පුරවා ගැනීමට" අවස්ථාවක් වූ බව ඔප්පු වී තිබේ. එනම් 2025 ජනවාරි මාසයේ ගාසා තීරයේ සිට 2025 ජුනි මාසයේදී ඉරානය දක්වා වූ සටන් විරාමය සහ සටන් විරාමයෙන් පැය කිහිපයකට පසු මධ්‍යම බේරූට් වෙත ඊශ්‍රායලය එල්ල කළ ප්‍රහාරයෙන් 250 කට වැඩි පිරිසක් මිය ගිය, අප්‍රේල් 7 වන දින ඉරාන සටන් විරාමය දක්වා, ට්‍රම්ප් මැද පෙරදිග ප්‍රකාශයට පත් කර ඇති සෑම සටන් විරාමයක්ම, ඊළඟ ප්‍රහාරය සඳහා නැවත කණ්ඩායම් ගත වීමමේ විරාමයක් වී තිබේ.

හෝමූස් සමුද්‍ර සන්ධියේ පාලනය, සහ ඒ සමඟ ඉරානයේ සහ සමස්තයක් ලෙස පර්සියානු ගල්ෆ් කලාපයේ තෙල් නිෂ්පාදනය සහ බෙදා හැරීම පාලනය කිරීම ආරම්භයේ සිටම යුද්ධයේ කේන්ද්‍රීය මූලෝපායික ඉලක්කයක් වී පැවතිණි.

යුද්ධය ආරම්භ වූ දා සිට, සමුද්‍ර සන්ධිය හරහා නැවුක ගමනාගමනය බිඳ වැටී ඇත. යුද්ධයට පෙර මට්ටමට වඩා ප්‍රවාහන පරිමාවන් සියයට 90 කට වඩා පහත වැටී ඇත. ඉතිරිව ඇති ගමනාගමනය මත ආධිපත්‍යය දැරුවේ ඉරානයේ තෙල් අපනයනයෙන් සියයට 80 සිට 90 දක්වා ප්‍රමාණයක් ආනයනය කරන එහි විශාලතම පාරිභෝගිකයා වන චීනයට බොරතෙල් රැගෙන යන ග්‍රීසියට අනුබද්ධ තෙල් නැව් සහ ඉරානයේ සෙවනැලි නැව් කණ්ඩායම (shadow fleet) විසිනි. ඉරානය තමන්ගේ මිතුරු වෙළඳ හවුල්කරුවන්ගේ, අන් සියල්ලටත් වඩා චීනයේ නැව්වලට ගමන් කිරීම සඳහා දිගටම ඉඩ දී ඇත.

දැන්, ඉරාන වරායකට ළඟා වීම සඳහා සමුද්‍ර සන්ධියට ඇතුළු වීමට උත්සාහ කරන ඕනෑම නෞකාවක් ඇමරිකානු අවසරයකින් තොරව එසේ කරන අතර, ඉරානය සමඟ නාවික වෙළඳාමේ යෙදෙන ඕනෑම රටකට එරෙහිව භෞතික ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාව විවෘත කරයි. චීන ආරක්ෂක අමාත්‍ය ඩොං ජුන් සඳුදා ප්‍රකාශ කළේ: "අපගේ නැව් හෝමූස් සමුද්‍ර සන්ධිය තුළට සහ ඉන් පිටතට ගමන් කරමින් තිබේ. අපට ඉරානය සමඟ වෙළඳ හා බලශක්ති ගිවිසුම් තිබේ. අපි ඒවාට ගරු කරන්නෙමු, ඒවා ඉටු කරන්නෙමු, එමෙන්ම අපගේ වැඩකටයුතු වලට සෙසු අය මැදිහත් නොවේ යැයි අපේක්ෂා කරමු."

ප්‍රායෝගිකව, හෝමූස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීම, ඉරානයට එරෙහිව මෙන්ම චීනයට එරෙහිව ද ආර්ථික යුද්ධ ක්‍රියාවකි. චීනයේ තෙල්වලින් අඩක් පමණ සහ එහි ද්‍රව ස්වාභාවික වායුවෙන් (liquefied natural gas) තුනෙන් එකකට වඩා හෝමූස් සමුද්‍ර සන්ධිය හරහා ගලා යයි. මෙම අවහිර කිරීම මගින් ඇමරිකානු හස්තය එහි ප්‍රධාන ප්‍රතිවාදියාගේ [චීනයේ] බලශක්ති සැපයුම මත තබන අතරම, එම ප්‍රවාහයන් මතම රඳා පවතින, ජපානය, දකුණු කොරියාව සහ යුරෝපීය සංගමයේ රාජ්‍යයන් ආදී එහි "සගයන්ගේ" බලශක්ති සැපයුම මත ද අත තබයි.

සඳුදා පැවති මාධ්‍ය හමුවකදී ට්‍රම්ප් එක්සත් ජනපද හමුදා මූලෝපායඥයින්ගේ චින්තනය ගැන ඉඟි කළේ: "අපට මෙම වෙළඳාම අවශ්‍ය නැත. අපට අවශ්‍ය ප්‍රමාණයට වඩා අපේම තෙල්, ගෑස් තිබේ. … එබැවින්

ISSN 3093-6217

අපට එය අවශ්‍ය නැත, නමුත් ලෝකයට එය අවශ්‍ය වන අතර, මේ අප කතා කරද්දීම, බොහෝ නැව් බඩු පවටා ගැනීම පිණිස අපේ රටට යමින් සිටී.” යනුවෙනි.

මෙම අවහිර කිරීම ලෝකයේ මූලෝපායික ඇවිරුම් ස්ථාන (chokepoints), එනම් හෝර්මුස් සමුද්‍ර සන්ධිය, පැනමා ඇළ, ග්‍රීන්ලන්තය සඳහා වන වන ප්‍රවේශයන් ආදිය අල්ලා ගැනීමේ පුළුල් එක්සත් ජනපද ව්‍යාපාරයක කොටසකි. දිගුකාලීන ආර්ථික පරිහානියක නිමග්න ඇමරිකානු අධිරාජ්‍යවාදය, ගෝලීය වෙළඳ මාර්ගවල මිලිටරි ආධිපත්‍යය හරහා එම පරිහානිය පියවා ගැනීමට උත්සාහ කරමින් සිටී. ලෝකයේ ජල මාර්ග සහ අමුද්‍රව්‍ය තමන්ටම සුරක්ෂිත කර ගනිමින් සහ ඒවා තම ප්‍රතිවාදීන්ට, විශේෂයෙන් චීනයට, අහිමි කරමින් සිටී.

2025 දෙසැම්බර් මාසයේදී, වෙනිසියුලානු වෙරළට ඔබ්බෙන්, වෙනිසියුලානු බොරතෙල් බැරල් මිලියන 1.8 ක් රැගෙන චීනය බලා යන තෙල් ටැංකියක් එක්සත් ජනපද හමුදා විසින් අල්ලා ගන්නා ලදී. හෝර්මුස් අවහිර කිරීම එම පූර්වාදර්ශය පර්සියානු ගල්ෆ් කලාපය දක්වා විහිදුවන අතර එක්සත් ජනපද යුද නැව් චීනය බලා යන තෙල් නැව් හරවා යැවීමට උත්සාහ කළහොත් චීනය සමඟ මිලිටරි ගැටුමක සෘජු අනතුර මතු කරයි.

ඉරානයට එරෙහි ඇමරිකානු අධිරාජ්‍යවාදයේ සාපරාධී යුද්ධයේ ආර්ථික ප්‍රතිවිපාක දැනටමත් විනාශකාරී ය. අවහිර කිරීමට පෙර පවා, හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා ගමනාගමනය සැලකිය යුතු ලෙස කපා හැරීම, ජාත්‍යන්තර බලශක්ති ඒජන්සිය ( International Energy Agency) විසින් ඉතිහාසයේ නරකම තෙල් අර්බුදය ලෙස හැඳින්වූ දෙය ජනනය කර ඇති අතර එය 1979 අර්බුදය ඉක්මවා ගියේය. තෙල් බැරලය ඩොලර් 100 ට වඩා වැඩිය, පෙට්‍රල් මිල ජාතිකව ගැලුමකට ඩොලර් 4.13 ක් වන අතර, නැව් 600 කට වැඩි ප්‍රමාණයක් ගල්ෆ් කලාපයේ සිරවී ඇත. ගෝල්ඩ්මන් සැක්ස් (Goldman Sachs) ආයතනය විසින් එක්සත් ජනපද අවපාතයක සම්භාවිතාව සියයට 30 දක්වා ඉහළ නංවා තිබේ.

ගෝලීය පොහොර සැපයුමෙන් තුනෙන් එකක් සාමාන්‍යයෙන් මේ සමුද්‍ර සන්ධිය හරහා ගමන් කරයි. යුද්ධය ක්ෂණික වෙළඳාමට බාධා ඇති කළා පමණක් නොව, ඉදිරි කන්නයේ බෝග අස්වැන්න කෙරෙහි ද දැඩි බලපෑමක් ඇති කරනු ඇත. එනම්, අප්‍රිකාව, දකුණු ආසියාව සහ ලතින් ඇමරිකාව පුරා අස්වනු අඩු කරනු ඇති අතර, ගල්ෆ් කලාපය හා සෘජු බැඳීමක් නොමැති රටවල ආහාර මිල කම්පන ඇති කරනු ඇත. මිලියන සිය ගණනක් ආහාර අනාරක්ෂිතභාවයට මුහුණ දෙන අතර මිලියන ගණනක් මිය යා හැකිය.

ගෝලීය සාගතයක සැබෑ හැකියාවක් පවතී.

ලෝක ආධිපත්‍යය සඳහා වූ එහි සැලැස්ම තුළ, යුද්ධයේ සැබෑ හැසිරීම වඩ වඩාත් මංමුලා සහගත අනුවර්තනය වීම් මගින් සංලක්ෂිත වී ඇත. පෙබරවාරි 28 වන දින එක්සත් ජනපදය යුද්ධය දියත් කර උත්තරීතර නායක අලි කමේනි සහ ජ්‍යෙෂ්ඨ ඉරාන නිලධාරීන් දුසිම් ගනනක් ඝාතනය කළේය. ට්‍රම්ප් ඉරාන වැසියන්ට ඔවුන්ගේ රජයට එරෙහිව නැගී සිටින ලෙස ඉල්ලා සිටි නමුත් ඔවුන් එසේ කළේ නැත. ඉන්පසු සිදුකළ බෝම්බ හෙලීමේ ව්‍යාපාරය ඉරානයේ විදුලි සංදේශ පද්ධතිය විනාශ කළ අතර එහි නගරවල දිස්ත්‍රික්ක සමතලා කළ නමුත් ඉරානය යටත් වූයේ නැත. මාර්තු මාසය පුරාම ඉරාන නායකයින් තවදුරටත් ඝාතනය කිරීමෙන්ද රජය ඇද වැටුණේ නැත. නාවික ගමන් අවහිර කිරීම ඊළඟ පියවරයි.

ඉරාන මිසයිල බැටරි, වෙරළබඩ ආරක්ෂක පද්ධති සහ දහස් ගණනක් නාවික බෝම්බ වලින් වට වූ පටුම ස්ථානයේ සමීප පරාසයේ සැතපුම් 21 ක් පළල ජල මාර්ගයක් තුළ ඇමරිකානු යුද නැව් දැන් ක්‍රියාත්මක වේ. මෙම නාවික අවහිරයට ළඟා වන ඕනෑම ඉරාන නෞකාවක් “වහාම වනසන” බව ට්‍රම්ප් සඳුදා පැවසීය.





මාක්ස්වාදය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම

Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

ඩිස්ට්‍රොයර් නෞකාවක් අහිමි වීම හෝ විශාල ජීවිත හානි සිදුවීමක් හේතුවෙන්, ඉරානයේ තෙල් අපනයනයෙන් සියයට 90 ක් සැකසෙන කාර්ග් දූපත අත්පත් කර ගැනීම ඇතුළුව භූමි ආක්‍රමණයක් සඳහා ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය තුළ ඇති ඉල්ලීම් තීව්‍ර වනු ඇත. 82 වන ගුවන් අංශයේ භට පිරිස් හා මැරීන් භටයින් දැනටමත් යොදවා ඇති අතර, 50,000 කට වැඩි එක්සත් ජනපද භට පිරිසක් රංග පතයේ සිටිති. පෙබරවාරි 28 වන දින සිට එක්සත් ජනපද හමුදා සාමාජිකයින් දහතුන් දෙනෙකු මිය ගොස් ඇත.

ට්‍රම්ප් පාලනය පුදුමාකාර නොසැලකිලිමත්කමකින් යුතුව ඉදිරියට යමින් සිටී. **එක්සත් ජනපදය ඉරානයේ තෙල් අත්පත් කර ගන්නා බව ඔහු විවෘතව පවසා ඇත. එය, පසුගිය පරිපාලනයන් සම්බාධක සහ ජාත්‍යන්තර නීතියේ භාෂාව පිටුපස සැඟව සිට සිදුකළ ආකාරයේ කොල්ලකාරී ප්‍රකාශයකි. අපරාධකාරී පාතාලයේ ක්‍රම දැන් නිල රාජ්‍ය ප්‍රතිපත්තිය වී ඇත.**

දේශපාලන සංස්ථාපිතය ප්‍රතිපත්තිමය වශයෙන් මේ කිසිවකට විරුද්ධ නොවේ. නිව් යෝර්ක් ටයිම්ස් කතුවැකි මණ්ඩලය ට්‍රම්ප්ගේ හැසිරීම "පැහැදිලි නොහැකියාව" ලෙස හැඳින්වූ අතර "කොංග්‍රසය සම්බන්ධ කර ගනිමින් හා ඇමරිකානු සහචරයින්ගෙන් උදව් ලබා ගන්නා ලෙස" ඔහුගෙන් ඉල්ලා සිටියේය. එය, යුද්ධයේ ඵලඟ අදියර ක්‍රියාත්මක කිරීමේදී ද්විපාර්ශ්වික සහයෝගීතාවයක් සඳහා කරන කැඳවීමකි. වෝල් ස්ට්‍රීට් ජර්නලය ට්‍රම්ප්ගේ ජයග්‍රහණ ප්‍රකාශය නිසි කලට පෙර කළ එකක් ලෙස හැඳින්වූ අතර "වැඩේ කොහෙත්ම අවසන් වී නැත" යනුවෙන් අනතුරු ඇඟවීය.

ඩිමොක්‍රටික් පක්ෂ සෙනෙට් සභික Tim Kaine ඉරිදා ABC ප්‍රවෘත්ති සේවය වෙත පැවසුවේ ඉරානය "කලාපීය තර්ජනයක්" බවත් "ඉරානයට න්‍යෂ්ටික අවියක් නොලැබෙන බවට අප සහතික විය යුතු" බවත්ය. ට්‍රම්ප් සතියකට පෙර "සටන් විරාමය" නිවේදනය කළ විට, හෝමුස් සමුද්‍ර සන්ධියේ පාලනය ඉරානය අත ඉතිරි කිරීම මත පදනම්ව ඩිමොක්‍රටික් පක්ෂය එය විවේචනය කිරීමට පැන ගත්තේය. **ඩිමොක්‍රටික් පක්ෂය මූලෝපායික අරමුණු පිළිගන්නා අතර ක්‍රියාවට නැගීම පිළිබඳව පමණක් විරුද්ධ වේ.**

**ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ සෑම අංශයක්ම යුද්ධය අනුමත කරන්නේ නම්, එයට එරෙහි විරෝධය පැමිණිය හැක්කේ මුළුමනින්ම සංස්ථාපිතයට පිටතින් පමණි.** කම්කරු පන්තිය තමන්ගේම ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීම හරහා නාවික අවහිර කිරීමට සහ සමස්තයක් ලෙස යුද්ධයට විරුද්ධ විය යුතුය. වැඩ කරන ජනතාවගේ ජීවත් වීම සඳහා පවතින සමාජ වැඩසටහන් වලට ඓතිහාසික ප්‍රහාරයක් එල්ල කිරීම හරහා යුධ වියදම් ගෙවනු ලැබේ. අප්‍රේල් 1 වන දින ධවල මන්දිරයේ දිවා භෝජනයකදී ට්‍රම්ප් පැවසුවේ රජය යුද්ධ කරන බැවින් මෙඩිකෙයාර් (Medicare) ,මෙඩිකේඩ් (Medicaid) සහ අනෙකුත් සමාජ වැඩසටහන් සඳහා මුදල් ගෙවිය නොහැකි බවයි.

අත්‍යවශ්‍ය වැඩසටහන් කපා හැරීමෙන් යුද්ධය සඳහා ගෙවීම් කරන ලෙස ඉල්ලා සිටිනු ලබන එම පන්තියෙන්ම (කම්කරු පන්තියෙන්ම) යුද්ධය සඳහා සටන් කිරීමටද කැඳවුම් කරනු ලැබේ.


2026 ජාතික ආරක්ෂක බලය පැවරීමේ (National Defense Authorization Act) පනතේ කොටසක් ලෙස ට්‍රම්ප් විසින් අත්සන් කර නීති ගත කරන ලද, වයස අවුරුදු 18 සිට 26 දක්වා සියලුම පිරිමින් සඳහා හමුදාවලට බැඳීමේ ස්වයංක්‍රීය ලියාපදිංචිය, 2026 දෙසැම්බර් මාසයේදී ක්‍රියාත්මක වේ. **ඇමරිකානු අධිරාජ්‍යවාදය වෙනුවෙන් චීනයෙන් බලශක්ති සැපයුම සුරක්ෂිත කිරීම සඳහා, වානේ කම්කරුවන්ගේ සහ ගබඩා සේවකයින්ගේ, පතල් කම්කරුවන්ගේ සහ සංක්‍රමණික ගොවිපල කම්කරුවන්ගේ දරුවන්, ඩිස්ට්‍රොයර් යාත්‍රා මත හා පර්සියානු ගල්ෆ් වෙරළ තීරය මත මිය යාමට යවනු ලැබේ.**

යුද්ධයට එරෙහි සටන, සමාජ වැඩසටහන් විනාශ කිරීමට, බලහත්කාරයෙන් හමුදා සේවයට බඳවා ගැනීමට සහ මිලිටරි-පොලිස් ආඥාදායකත්වයක් ස්ථාපිත කිරීමට එරෙහි සටනෙන් වෙන් කළ නොහැකිය. **රැකියා, වැටුප් සහ ජීවන තත්වයන් ආරක්ෂා කිරීමේ සටන අධිරාජ්‍යවාදී යුද්ධයට සහ මෙම සමාජ ව්‍යාධීන්ගේ මූල හේතුව වන ධනේශ්වර ක්‍රමයට එරෙහි අරගලය සමඟ ඒකාබද්ධ කළ යුතුය.**

(අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි)

Featured Image: 2026 මාර්තු 18 වන දින එෆික් ෆියුරි මෙහෙයුම අතරතුර ආර්ලී බර්ක් පන්තියේ නියෙමු මිසයිල විනාශ කරන යාත්‍රාවක් වන USS ෆ්‍රෑන්ක් ඊ. පීටර්සන් ජූනියර්, අරාබි මුහුදේ යාත්‍රා කරන ආකාරය [ඡායාරූපය: එක්සත් ජනපද නාවික හමුදාව]

---




මෙම පොතේ 2014 සහ 2024 අතර ඩේවිඩ් නෝර්ත් විසින් පවත්වන ලද වාර්ෂික මැයි දින කතා අඩංගු වේ. එය අධිරාජ්‍යවාදී මිලිටරිවාදයේ අනවරත උත්සන්න වීම සහ න්‍යෂ්ටික තුන්වන ලෝක යුද්ධයක වැඩෙන අන්තරාය පිළිබඳ අසාමාන්‍ය හා කාලෝචිත වසරින් වසර කරන විශ්ලේෂණයකි. Mehring Books වෙතින් එය ඇණවුම් කරන්න.

 ISSN 3093-6217

# ඉරානය ඉලක්ක කරගත් හෝමුස් සමුද්‍ර සන්ධියේ ඇමරිකානු අවහිර කිරීමට එක්වීම යුරෝපීය රාජ්‍යයන් ප්‍රතික්ෂේප කරයි



යුක්රේනය පිළිබඳ සාකච්ඡා සඳහා 2025 පෙබරවාරි 17 වන දින එලිසී මාලිගයේදී ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් විසින් පවත්වන ලද රැස්වීමකට එක්සත් රාජධානියේ අගමැති ශ්‍රීමත් කීර් ස්ටාර්මර් (වමේ, මැද) සහභාගී වේ. [ඡායාරූපය සයිමන් ඩෝසන්/අංක 10 ඩව්නිං වීදිය/ෆ්ලිකර් / CC BY-NC-ND 2.0]

ඇලෙක්ස් ලැන්ටියර් විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අප්‍රේල් *15* වන දින "***European states refuse to join in US blockade of Strait of Hormuz targeting Iran***" යන හිසින් පළවූ **ඇලෙක්ස් ලැන්ටියර්** විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.

පසුගිය සතියේ ඉරානයට එරෙහි ආක්‍රමණශීලී යුද්ධයේදී සටන් විරාමයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, ට්‍රම්ප් ඉරිදා ප්‍රකාශයට පත් කළ හෝමුස් සමුද්‍ර සන්ධියේ අවහිර කිරීමට සම්බන්ධ වන ලෙස ට්‍රම්ප් පරිපාලනය කළ ඉල්ලීම් යුරෝපීය ආන්ඩු ප්‍රතික්ෂේප කර තිබේ. එමගින්, එක්සත් ජනපදය සමඟ වන යුරෝපීය සබඳතාවල දුරදිග යන සහ ඓතිහාසික බිඳවැටීමක් සිදුවෙමින් පවතින බව පෙන්නුම් කරයි.

ඒ සමගම, යුරෝපීය ධනේශ්වරයේ ප්‍රතිචාරය සියල්ලටම වඩා බියගුලුකම සහ කුහකකම මගින් සලකුණු කර ඇත. හෝමුස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීම යුද ක්‍රියාවක් පමණක්ම නොව, මෙම වසා දැමීම මගින් යුරෝපයට සහ මුළු ලෝකයටම අත්‍යවශ්‍ය තෙල්, ගෑස් සහ පොහොර සැපයුම් කපා හරිනු ඇත. එහෙත් යුරෝපීය රජයන් කිසිවක් අවහිර කිරීම හෙළා දැකීමට, එය අවසන් කිරීම සඳහා කැඳවීමට, යුද්ධය නතර කිරීමට ඉල්ලා සිටීමට හෝ එක්සත් ජනපද රජයට මිලිටරි හා මූල්‍ය ආධාර දීම අවසන් කිරීමට එඩිතර වී නැත.

ඒ වෙනුවට, ඔවුන් නියෝජනය කරන දූෂිත ධනේශ්වර කතිපයාධිකාරයේ දෘෂ්ටිය පිළිබිඹු කරමින්, යුරෝපීය ආන්ඩු පර්සියානු ගල්ෆ් කලාපයේ නාවික මැදිහත්වීමක් පිළිබඳව සාකච්ඡා කිරීම දිගටම කරගෙන යන්නේ, එවැන්නක් මෙතෙක් එක්සත් ජනපද නාවික හමුදාව ඉරානයේ වෙරළට පහර දීමෙන් වළක්වා ඇති ඉරාන මිසයිල තර්ජනයටම මුහුණ දෙනු ඇති තත්ත්වයක් තුළය. වොෂින්ටනයෙන් ස්වාධීනව හෝමුස් සමුද්‍ර සන්ධියට සම්බන්ධීකරණය කරන ලද නාවික මෙහෙයුමක් සූදානම් කිරීම සඳහා සිකුරාදා දින, බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය රටවල් 40 ක සන්ධානයක සමුළු රැස්වීමක් කැඳවා ඇත.

"සටන් වැද සිටින පාර්ශවයන්ගෙන් වෙන් වූ මෙම දැඩි ආරක්ෂක මෙහෙයුම, තත්වය ඉඩ දුන් වහාම යොදවනු ඇත," ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් පැවසීය. "රාජ්‍ය

තාන්ත්‍රික මාර්ගය හරහා මැද පෙරදිග ගැටුමට ස්ථිර හා කල් පවතින විසඳුමක්, සෑම කෙනෙකුටම සාමයෙන් හා ආරක්ෂාවෙන් ජීවත් විය හැකි ශක්තිමත් රාමුවක් කලාපයකට සපයන විසඳුමක්" ඔහු ඉල්ලා සිටියේය. "ඉරානයේ න්‍යෂ්ටික සහ බැලස්ටික් ක්‍රියාකාරකම් මෙන්ම කලාපය තුළ එහි අස්ථාවර ක්‍රියාවන්" ඔහු හෙළා දුටුවේය.

මැක්‍රොන්ගේ මුසාවන් විශ්මයජනකය. මැද පෙරදිග සාමය හා ආරක්ෂාවට මූලික තර්ජනය පැමිණෙන්නේ මෙම යුද්ධය හෝ තමන්ට එරෙහිව දියත් කරන ලද වෙනත් කිසිදු යුද්ධයක් ආරම්භ නොකළ ඉරානයෙන් නොව, වොෂින්ටනයෙන් සහ ඇමරිකාවේ ෆැසිස්ට් ජනාධිපතිවරයා විසින් දියත් කරන ලද මෙම සමූලඝාතන යුද්ධයෙන් ය. මැද පෙරදිග සාමය සම්බන්ධයෙන් ගත් කල, ගාසා තීරයේ සමූල ජන සංහාරය මධ්‍යයේ ඊශ්‍රායල රජය සමඟ මැක්‍රොන්ගේ මිත්‍රත්වය නිරන්තරයෙන් අවධාරණය කිරීමෙන් පැරිසිය එයට වල කැපීමට හවුල් වේ.

ජර්මනියේදී ආරක්ෂක අමාත්‍ය බොරිස් පිස්ටෝරියස් ප්‍රතිචාර දැක්වූයේ, "මේ යුද්ධය අපේ යුද්ධයක් නොවේ, අපි එය ආරම්භ කළේ නැහැ... බලවත් එක්සත් ජනපද නාවික හමුදාවට පවා හෝමුස් සමුද්‍ර සන්ධිය විවෘත කර ගැනීම කල නොහැකි වූ විට, යුරෝපීය යුද නැව් අතලොස්සක් මගින් ඩොනල්ඩ් ට්‍රම්ප්ට හෝර්මුස් සමුද්‍ර සන්ධිය තුළ ඉටු කර ගැනීමට අවශ්‍ය වන්නේ කුමක්ද?" චාන්සලර් ෆ්‍රෙඩ්රික් මර්ස්ගේ කාර්යාලය ප්‍රකාශයක් නිකුත් කළේ ඉරානයට එරෙහි ට්‍රම්ප්ගේ යුද්ධය "නේටෝව සමඟ කිසිදු සම්බන්ධයක් නැත" යනුවෙනි.

මර්ස්ගේ ප්‍රකාශය කණගාටුදායක මගහැරීමකි, මන්ද ට්‍රම්ප් ඉරානය සමඟ කරන යුද්ධය සහ විශේෂයෙන් ඔහු හෝමුස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීම යුරෝපයට ප්‍රධාන බලශක්ති සැපයුම් කපා හරින බව පැහැදිලි හෙයිනි. මෙය සිදු වන්නේ, එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන් රුසියාවට යන ජර්මනියේ නෝර්ඩ්ස්ට්‍රීම් නල මාර්ගය විනාශ කරන බවට තර්ජනය කිරීමෙන් පසුව එය විනාශ කිරීමෙනි. මෙසේ යුරෝපයේ බලශක්ති සැපයුම කපා හැරීමට සෘජුවම තර්ජනය කරමින් සිදුවන මෙම ස්ථාවර එක්සත් ජනපද ප්‍රතිපත්තිය, නිසැකවම "නේටෝව සමඟ සම්බන්ධ වේ."

බ්‍රිතාන්‍ය අගමැති කීර් ස්ටාර්මර් බීබීසී රේඩියෝවට මෙසේ පැවසීය: "අපි මෙම අවහිර කිරීමට සහාය නොදෙන්නෙමු; සියලු ආකාරයේ රාජ්‍ය තාන්ත්‍රික දක්ෂතාවහන්, දේශපාලනිකව සහ හැකියාවන් ...ඒ සියල්ල අපගේ දෘෂ්ටි කෝණයෙන්, සමුද්‍ර සන්ධිය සම්පූර්ණයෙන්ම විවෘත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත." ඔහු තවදුරටත් මෙසේ පැවසීය: "පීඩනය කුමක් වුවත්–එමෙන්ම ඒ සඳහා සැලකිය යුතු පීඩනයක් තිබුණිද–අපි යුද්ධයට ඇදී නොයමු. එය අපගේ ජාතික අවශ්‍යතාවයන් සපුරන්නේ නොවේ, මන්ද එයට පැහැදිලි, නීත්‍යානුකූල පදනමක් සහ පැහැදිලි සිතා බලා කළ හැකි සැලැස්මක් නොමැති නම් මම ක්‍රියා නොකරමි."

කම්කරු මුල් (කාලීන)අධ්‍යාපන අමාත්‍ය ඔලිවියා බේලිගෙන් ප්‍රශ්න කිරීමේදී යුරෝපීය රජයන්ගේ දෙබිඩි ස්ථාවරය මතු විය. ස්කයි නිවුස් මාධ්‍යවේදීන් ඇය එක්සත් ජනපද අවහිරයට සහාය දක්වන්නේ දැයි හය වතාවක් විමසීය. බේලි ඔව් හෝ නැත යනුවෙන් පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළ අතර, ඒ වෙනුවට ඇය නැවත නැවතත් පිළිතුරු දුන්නේ: "අපි අවහිරයට සහභාගී නොවන්නෙමු, එමෙන්ම මුහුදේ නිදහස් සංචලනයේ ඉතා වැදගත් මූලධර්මය අපි විශ්වාස කරන අතර හෝර්මුස් සමුද්‍ර සන්ධිය තුල නිදහස් සංචලනයක් දැකීමට අපට අවශ්‍යයි."යනුවෙනි.

යුරෝපීය ආන්ඩු වල ප්‍රතිපත්තිය එක් මූලික පරස්පර විරෝධයක් සනිටුහන් කරයි. එක්සත් ජනපද රජය ඔවුන් ඉලක්ක කර ගනිමින් යුද පියවර ගන්නා විට, ඔවුන් පළිගන්නේ එක්සත් ජනපදයට එරෙහිව නොව ඉරානයට සහ මැද පෙරදිගට එරෙහිව ය. **ට්‍රම්ප් සමඟ ඔවුන්ගේ සහයෝගිතාවයට යටින් පවතින්නේ පුද්ගලික බියගුලුකම පමණක් නොව, සියල්ලටත් වඩා වෛෂයික අධිරාජ්‍යවාදී අවශ්‍යතා ය. යුරෝපීය බලවතුන් මැදිහත් වන්නේ තමන්ගේම හමුදා කඳවුරු සහ මැද පෙරදිගින් ලබාගත් ලාභ ආරක්ෂා කර ගැනීමට සහ වෝල් වීදිය හා මූල්‍ය සබඳතා මෙන්ම ඇමරිකානු අධිරාජ්‍යවාදය සමඟ ඔවුන්ගේ නේටෝ මිලිටරි සන්ධානය පවත්වා ගැනීමට ය.**

යුද්ධයේ ජීවිත හානි සහ ගැටුමෙන් මිලියන සංඛ්‍යාත කම්කරුවන්ගේ රැකියා සහ සමස්ත ජනගහනයේ මිලදී ගැනීමේ ශක්තිය කෙරෙහි ඇති කරන විනාශකාරී ආර්ථික බලපෑම පිළිබඳව මැක්‍රොන්, ස්ටාර්මර් සහ යුරෝපය පුරා අනෙකුත් ධනේශ්වර ආණ්ඩු වල නායකයින්ට එතරම් වැඩක් නැත. යුරෝපයේ හෝ ලෝකයේ වැඩ කරන ජනතාවගේ යහපැවැත්මට වඩා ට්‍රම්ප්ගේ යුද්ධයේ ආරම්භක අසාර්ථකත්වයෙන් වඩ වඩාත් තර්ජනයට ලක්ව ඇති ලෝක අධිරාජ්‍යවාදයේ මැද පෙරදිග ආධිපත්‍යය බේරා ගැනීම ගැන ඔවුන් ඊට වඩා බොහෝ සෙයින් සැලකිලිමත් වෙයි.

**ඇමරිකානු අධිරාජ්‍යවාදී විදේශ ප්‍රතිපත්තියේ වඩාත්ම ප්‍රතිගාමී අංගවලට අභියෝග කිරීම යුරෝපීය බලවතුන් ප්‍රතික්ෂේප කළද, වොෂින්ටනය සහ එහි යුරෝපීය නේටෝ "සහචරයින්" අතර භේදය දිනෙන් දින පුළුල් වෙමින් හා පුපුරන සුලු ලෙස වර්ධනය වෙමින් පවතී.**

මේ සඳහා එක් ඇඟවීමක් වන්නේ නේටෝ අධිරාජ්‍යවාදී බලවතුන් අතර වැඩෙන මූල්‍ය හා ආර්ථික ආතතීන් ය. යුරෝපය ට්‍රම්ප්ගේ තීරුබදු වලට යටත් නොවන්නේ නම්, එක්සත් ජනපද ස්වාභාවික ද්‍රව ගෑස් අපනයනය කපා හැරීමට ට්‍රම්ප් තර්ජනය කරන විට, යුරෝපීය පන්තියේ බලවත් බලවේග එක්සත් ජනපද ඩොලරයට එරෙහිව මාරුවක් ගවේෂණය කරමින් සිටී. **මැද පෙරදිග තෙල් හා ගෑස් වෙළඳාමෙන් ඩොලරය කපා හැරීම නිසා බලශක්තිය මිලදී ගැනීම සඳහා රටවල් ඩොලර් තබා ගැනීමේ අවශ්‍යතාවය අඩු වන බැවින්, ඔවුන්**

ISSN 3093-6217

**ඩොලරයට විකල්ප කෙරෙහි උනන්දුවක් දක්වන බවට සංඥා කරයි.**

මෙම මස මුලදී, ප්‍රංශයේ මහ බැංකුව පැරිසියේ තම සංචිත සුරක්ෂිතාගාරයේම තබා ගැනීම සඳහා රත්‍රන් මිලදී ගැනීමට එක්සත් ජනපදයේ ඉතිරිව ඇති රන් සංචිත ඈවර කළේය. ජර්මනියේ, ඉතාලියේ සහ අනෙකුත් ප්‍රමුඛ යුරෝපීය බලවතුන්ගේ නිලධාරීන් එක්සත් ජනපදයේ තබා ඇති තමන්ගේම රන් සංචිත යුරෝපයට ආපසු ලබා ගැනීමේ හැකියාව පිළිබඳව විවාද කරන අතරතුර මෙය සිදු වේ.

යුරෝක්ලියර් ගෙවීම් නිෂ්කාශන පද්ධතිය (Euroclear payment-clearing system), චීන බැඳුම්කරවල වැඩිපුර ආයෝජනය කිරීම සහ ඇමරිකානු ඩොලර් වත්කම්වලින් චීන රෙන්මින්බි-නාමික වත්කම් වෙත ප්‍රාග්ධනය මාරු කිරීම මගින් ඩොලරයෙන් ඈත් වීම සලකා බලන බවට ද සංඥා කර ඇත. එය ප්‍රකාශයක් නිකුත් කරමින් මෙසේ පැවසීය: “විවිධාංගීකරණය (Diversification) යනු ප්‍රාග්ධන වෙළඳපොළවල සැබවින්ම ක්‍රියාත්මකවීමට පටන්ගෙන ඇති දෙයකි. ගෝලීය ආයෝජකයින් සොයන ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ චීනයේ අවශ්‍යතා සහ නියාමන අවශ්‍යතා සපුරාලිය හැකි ආකාරය බැලීම සඳහා උත්සාහ කිරීමේ විවෘත කිරීමක් තිබේ.”

බලශක්ති කප්පාදුවක් පිළිබඳ එක්සත් ජනපද තර්ජන දෘශ්‍යමාන ලෙස යුරෝපීය ආර්ථිකයට මාරාන්තික තර්ජනයක් එල්ල කරන අතර, එවැනි මූල්‍ය පියවරයන් එක්සත් ජනපද ආර්ථිකයට ද ඒ හා සමාන තර්ජනයක් එල්ල කරයි. යුරෝපීය ආයෝජකයින් එක්සත් ජනපද වත්කම්වල ඇස්තමේන්තුගත මුළු ඩොලර් ට්‍රිලියන 8 ක්, භාණ්ඩාගාර බැඳුම්කර, කොටස් සහ ආයතනික (සංගත) බැඳුම්කර ලෙස තබාගෙන සිටින අතර එය එක්සත් ජනපද ස්වෛරී ණයෙන් සියයට 24 කට සමාන වේ. ඇමරිකානු ඩොලර් වත්කම් මත වැඩි වැඩියෙන් අඩු වන ප්‍රතිලාභ හේතුවෙන් හෝ එක්සත් ජනපද තීරුබදු හෝ බලශක්ති තර්ජනවලට පළිගැනීමක් ලෙස හෝ යුරෝපීය ආයෝජකයින් ඔවුන්ගේ එක්සත් ජනපද භාණ්ඩාගාර බැඳුම්කර ඉවත දැමුවහොත්, එය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 38 ක ස්වෛරී ණයෙහි දැවැන්ත අර්බුදයක් සහ එක්සත් ජනපද පොලී අනුපාත ඉහළ යාමක් ඇති කළ හැකිය.

**නේටෝ අධිරාජ්‍යවාදී බලවතුන් අතර ඇති මෙම පුපුරන සුලු ගැටුම්, ධනේශ්වර ක්‍රමය තුළ ලෝක ආර්ථිකය සහ ජාතික රාජ්‍ය පද්ධතිය අතර ඇති මූලික ප්‍රතිවිරෝධතාව නැවතත් පෙන්නුම් කරයි.** 20 වන සියවසේ ශ්‍රේෂ්ඨ මාක්ස්වාදීන් එම සියවසේ ලෝක යුද්ධ දෙකෙහි මූලාශ්‍රය ලෙස එය හඳුනා ගෙන තිබුණි. 21 වන සියවසේ කම්කරුවන් සඳහා තීරනාත්මක කර්තව්‍යය වන්නේ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව කම්කරු පන්තිය තුළ ජාත්‍යන්තර ව්‍යාපාරයක් වර්ධනය කිරීම මගින් ධනවාදය ගෝලීය යුද්ධයට සහ සමූල ජන සංහාරයට වේගයෙන් ඇද වැටීම නැවැත්වීම සහ ධනේශ්වර කතිපයාධිකාරය අතින් බලය ලබාගෙන සමාජවාදය ස්ථාපිත කිරීමයි. (අවධාරණය පරිවර්තනයේදී එකතු කෙරිණි)

---

**ගාසා ජන සංහාරය නවතනු!**

**අධිරාජ්‍යවාදය භංග කරනු! සයොන්වාදය පරාජය කරනු!**

**යුද අපරාධකරුවන් වගවීමට ලක් කරනු!**

**ඉරානයට අත නොතබනු - ඇමරිකානු-ඊශ්‍රායල යුද්ධය වහා නවතනු!**

**සියලුම ඇමරිකානු හමුදා නැවත කැඳවනු! කඳවුරු වසා දමනු!**

**තෙල් සඳහා තවත් ලේ නැත – සම්පත් අත්පත් කර ගැනීම අවසන් කරනු!**

**මිලිටරිය සඳහා අරමුදල් නවතනු! පාසල්, රෝහල්, නිවාස සඳහා අරමුදල් සපයනු!**

**ඉරාන කම්කරුවන් සමඟ සහයෝගීතාවය ගොඩ නගනු! අධිරාජ්‍යවාදී ආක්‍රමණයට හා පාලක රෙජිමයට එරෙහිව ඉරාන ජනතාව ආරක්ෂා කරනු!**

**කම්කරු ක්‍රියාකාරී කමිටු ගොඩනගනු! ජාත්‍යන්තරව සෑම සේවා ස්ථානයකම කාර්මික ශක්තිය එක්සත් කරනු!**

**වැඩ අඩාල කිරීමේ සිට මහා වැඩ වර්ජනය දක්වා සටන් කරනු! යුද යන්ත්‍රය නවතනු!**

**කම්කරු පන්තියේ ස්වාධීන බලය ගොඩ නගනු!**

**IMF කප්පාදු එපා! සියලු විදෙස් ණය අහෝසි කරනු!**

# සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් ගැඹුරු බෙදීම් මධ්‍යයේ, ඊශ්‍රායලය ලෙබනනයට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරයි

**ඇන්ඩෲ ඩේමන්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අප්‍රේල් *08* වන දින "***Amid deep divisions over ceasefire agreement, Israel launches massive attack on Lebanon***" යන හිසින් පළවූ ඇන්ඩෲ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

මැද පෙරදිග පුරා සිදුවෙමින් පවතින බෝම්බ ප්‍රහාර සහ එක්සත් ජනපදය තුළම තීව්‍ර වන අභ්‍යන්තර අර්බුදයක් මධ්‍යයේ, ට්‍රම්ප් විසින් අගහරුවාදා රාත්‍රියේ ඉරානය සමඟ ප්‍රකාශයට පත් කරන ලද සති දෙකක "සටන් විරාමය" එක් දිනක් ඇතුළත දැනටමත් බිඳ වැටෙමින් තිබේ. තම අරමුණු සාක්ෂාත් කර නොගත් යුද්ධයකින් පසු, ඉදිරියට යා යුතු ආකාරය සම්බන්ධයෙන් පාලක පන්තිය සහ රාජ්‍ය යාන්ත්‍රණය තුළ තියුණු බෙදීම් ඇති වී තිබේ.

සමස්ත තත්වයම, ඉරානයට එරෙහි අධිරාජ්‍යවාදී යුද්ධයට යම් ආකාරයක සාමකාමී විසඳුමක් සඳහා බලාපොරොත්තු මත විශ්වාසය නොතැබීමටත්, ස්වාධීන මහජන, යුද විරෝධී ව්‍යාපාරයක් වර්ධනය කිරීමේ හදිසි අවශ්‍යතාවයක් කම්කරු පන්තිය තුළ මතු කරයි.

සටන් විරාමයේ පදනම ලෙස එකඟ වූ දේ පවා සම්පූර්ණයෙන්ම අපැහැදිලිය, එමෙන්ම මතභේදාත්මක ය. ගිවිසුම ප්‍රකාශයට පත් කිරීමෙන් පැය කිහිපයකට පසු, බදාදා ඊශ්‍රායලය ලෙබනනයට දැවැන්ත බෝම්බ ප්‍රහාරයක් එල්ල කළේය. 2006 සිට ඊශ්‍රායල ප්‍රහාරවලින් පසු, එරටට ප්‍රහාර එල්ල වූ මාරාන්තිකම දිනය එය විය.



2023 දෙසැම්බර් 14 වන දින, ගුවන් යානා ප්‍රවාහන නෞකාවක් වන යූඑස්එස් ඩ්වයිට් ඩී. අයිසන්හවර් (USS Dwight D. Eisenhower) සහ වේගවත් සටන් ආධාරක නෞකාවක් වන යූඑස්එන්එස් සප්ලයි (USNS Supply) හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ගමන් කරයි. [Photo: Navy Petty Officer 2nd Class Keith Nowak]

අවම වශයෙන් පුද්ගලයින් 254 දෙනෙකු මිය ගිය අතර ළමුන් 35 දෙනෙකු ඇතුළුව 1,100 කට වැඩි පිරිසක් තුවාල ලැබූහ. මධ්‍යම බේරූට් සහ දකුණු තදාසන්න ප්‍රදේශ හරහා මහල් නිවාස ගොඩනැගිලි, නේවාසික වීදි සහ ජනාකීර්ණ වාණිජ ප්‍රදේශවලට ඊශ්‍රායල ජෙට් යානා මගින් ප්‍රහාර එල්ල විය.

එක්සත් ජනපදය සහ ඉරානය අතර සටන් විරාමය මුලින්ම ප්‍රකාශයට පත් කරන ලද්දේ ගිවිසුමට මැදිහත් වූ පකිස්ථාන අගමැති ෂෙබාස් ෂරීෆ් විසිනි. අඟහරුවාදා සවස ඔහුගේ නිවේදනයේ දී ෂරීෆ් ප්‍රකාශ කළේ එක්සත් ජනපදය සහ ඉරානය "ඔවුන්ගේ සහචරයින් සමඟ ලෙබනනය සහ වෙනත් තැන්වල ඇතුළුව සෑම තැනකම ක්ෂණික සටන් විරාමයකට එකඟ වී ඇති" බවයි.

බදාදා දින, ඉරාන පාර්ලිමේන්තුවේ කථානායක මොහොමඩ් බාගර් ගලිබාෆ් විසින් එක්සත් ජනපදය, තම ඊශ්‍රායල සගයා හරහා ලෙබනනයට දිගින් දිගටම පහර දීමෙන් සටන් විරාමය උල්ලංඝනය කරන බවට චෝදනා කරමින්, "එවැනි තත්වයක් තුළ, ද්විපාර්ශ්වික සටන් විරාමයක් හෝ සාකච්ඡා අයුක්ති සහගත වේ" යනුවෙන් ලිවීය. ලෙබනනය ගිවිසුමෙන් ආවරණය නොවූ බව ඊශ්‍රායලය ප්‍රකාශ කරයි. ට්‍රම්ප් සහ ධවල මන්දිර මාධ්‍ය ලේකම් කැරොලයින් ලෙවිට් යන දෙදෙනාම බදාදා දින ඊට සහාය දුන්

ප්‍රකාශයක් නිකුත් කළ අතර, ට්‍රම්ප් එය "වෙනම ගැටුමක්" ලෙස සඳහන් කළේය.

එක්සත් ජනපද-ඉරාන සටන් විරාම ගිවිසුම කඩාකප්පල් කිරීම සඳහා ඊශ්‍රායලය ලෙබනනයට ප්‍රහාරයක් එල්ල කළ බවට වන ඇඟවීම් තිබේ. වෝල් ස්ට්‍රීට් ජර්නලය බදාදා "සටන් විරාම ගිවිසුම පිළිබඳව ඊශ්‍රායලයට දැනුම් දුන්නේ ප්‍රමාද වී ය, ඒ පිළිබඳව එය සතුටින් සිටියේ නැත" යන මාතෘකාව යටතේ ලිපියක් ප්‍රකාශයට පත් කරමින්, ඊශ්‍රායලය "ඉරාන සාකච්ඡාවලට විධිමත් ලෙස සහභාගී නොවූ" බව වාර්තා කළේය.

කෙසේ වෙතත්, ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය තුළ සැලකිය යුතු කන්ඩායම්වල සහාය නොමැතිව ඊශ්‍රායලය මෙවැනි පරිමාණයක ප්‍රහාරයක් දියත් නොකරනු ඇත.

එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය තුළ, ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් යන දෙපාර්ශවයේම විවේචන කේන්ද්‍රගත වූයේ, ට්‍රම්ප්ගේ සටන් විරාම නිවේදනය ඇමරිකානු අධිරාජ්‍යවාදයට පරාජයක් ලෙසත් ඉරානයට ලබා දෙන අන්තරාදායක හා පිළිගත නොහැකි සහනයක් ලෙස හෙළා දැකීම මත ය.

සටන් විරාමය "යුද්ධයට තුඩු දුන් කිසිදු මූලික ගැටලුවක් විසඳුවේ නැත,"යි නිව් යෝර්ක් ටයිම්ස් පුවත්පතේ ජ්‍යෙෂ්ඨ ජාතික ආරක්ෂක වාර්තාකරු ඩේවිඩ් සැන්ගර් බදාදා ලිවීය. "සමුද්‍ර සන්ධියේ පාලනය ඉරානය යටතේ පවතින" බව ප්‍රකාශ කළ නව ඇමරිකානු ආරක්ෂක මධ්‍යස්ථානයේ ( Center for a New American Security) රිචඩ් ෆොන්ටේන් උපුටා දක්වමින් සැන්ගර් මෙසේ පැවසීය:"ඉරානය ප්‍රධාන බලශක්ති මුරපොලක පාලනය දින නියමයක් නොමැතිව තබා ගන්නා තත්වයක් එක්සත් ජනපදයට සහ ලෝකයට පිළිගත හැකි යැයි විශ්වාස කිරීමට අපහසුය. එය යුද්ධයට පෙර පැවති තත්වයට වඩා සැලකිය යුතු ලෙස වඩාත් නරක ප්‍රතිඵලයක් වනු ඇත."

වෝල් ස්ට්‍රීට් ජර්නල් කර්තෘ මණ්ඩලය බදාදා "ට්‍රම්ප් ඉරානයේදී නියමිත කාලයට පෙර ජයග්‍රහණයක්" ප්‍රකාශ කරයි" යන මාතෘකාව යටතේ ලිපියක් මගින් ප්‍රකාශයට පත් කළ අතර, "ඉරාන තන්ත්‍රය හෝමුස් සමුද්‍ර සන්ධියේ තර්ජනයක් ලෙස පවතින අතර කාර්යය තවමත් අවසන් වී නැත" යනුවෙන් තර්ක කළේය. ට්‍රම්ප්ගේ "යුද්ධය පිළිබඳ අසංගත වාචාලකම" විවේචනය කළ ජර්නලය මෙසේ නිගමනය කළේය: "ට්‍රම්ප් මහතා සඳහා ඊළඟ පරීක්ෂණය වනුයේ ඔහු සති දෙකක සටන් විරාම කාල සීමාව බැරෑරුම් ලෙස සලකන්නේද යන්නයි. ඔහු එසේ කරන්නේ නම් සහ ඉරානය එහි සුපුරුදු ක්‍රීඩාවන්හි යෙදෙන්නේ නම්, ඔහුට සැබවින්ම 'වැඩ අවසන් කිරීමට (finish the job)" සිදුවනු ඇත."

වොෂින්ටන් පෝස්ට් තීරු රචක මැක්ස් බූට් බදාදා දින මෙසේ ලිවීය, ඉරානය "අඩුම තරමින් දැනට හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා ගමන් කරන නැව් පාලනය කිරීමට සමත් වී ඇත. මෙම යුද්ධය ආරම්භ වන විට එය එසේ නොවීය."

දින කිහිපයකට පෙර "තුන්වන ලෝක යුද්ධය" ගැන අනතුරු ඇඟවූ, ට්‍රම්ප්ට "යුද අපරාධ" පිළිබඳව චෝදනා කළ සහ ඔහුගේ නියෝග ක්‍රියාත්මක කරන සොල්දාදුවන්ට යුද නීති යටතේ නඩු පවරනු ලබන බවට අනතුරු ඇඟවූ ඩිමොක්‍රටික් පක්ෂය, ඔවුන්ගේ විවේචනවල ස්වරය වෙනස් කරමින් සිටී: එනම්, ට්‍රම්ප් ඕනෑවට වඩා ගිය බව නොව, ඔහු ඔටුනු ආභරණ විකුණා දැමූ බවත්, ඔහු එක්සත් ජනපද අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය නිව්යෝර්ක් දේපළ වෙළඳාම් ගනුදෙනුවක් ලෙස සලකන බවත්ය.

"නමුත් ඉරානයට දැන් සමුද්‍ර සන්ධිය ස්ථිරවම තිබේ නම්, මෙම මුළු උත්සාහයම මොනතරම් වැරැද්දක්ද, මොනතරම් වැරදි ගණනය කිරීමක්ද," යනුවෙන් ඩිමොක්‍රටික් සෙනෙට් සභික ක්‍රිස් මර්ෆි බදාදා CNN වෙත පැවසීය.

ට්‍රම්ප් පරිපාලනයේ දෘෂ්ටි කෝණයෙන් බලන කල, "සටන් විරාමයක්" යනු කිසිදු අර්ථයක් නැත. මැද පෙරදිග ට්‍රම්ප් විසින් ප්‍රකාශයට පත් කරන ලද සෑම "සටන් විරාමයක්ම" තවදුරටත් ලේ වැකි මිලිටරි ක්‍රියාමාර්ග සඳහා පූර්විකාවක් ලෙස ක්‍රියා කර ඇත. ඉරානයේ න්‍යෂ්ටික මධ්‍යස්ථානවලට B-2 බෝම්බ හෙලීමේ Operation Midnight Hammer මෙහෙයුමෙන් පසු 2025 ජූනි මාසයේ එළැඹි සටන් විරාමයෙන් මාස අටක් ඇතුළත, පෙබරවාරි 28 වන දින මෙම පූර්ණ පරිමාණ යුද්ධය ආරම්භ විය.

බදාදා අඟහාගයේදී ට්‍රම්ප් Truth Social හි පළ කළේ, "දැනටමත් සැලකිය යුතු ලෙස පිරිහී ඇති සතුරෙකුට මාරාන්තික ප්‍රහාරයක් එල්ල කිරීමට සහ විනාශ කිරීමට සුදුසු සියලුම එක්සත් ජනපද නැව්, ගුවන් යානා සහ හමුදා පිරිස්, අතිරේක පතොරම්, ආයුධ සහ වෙනත් ඕනෑම දෙයක්, එළඹෙන සැබෑ ගිවිසුමේ කොන්දේසි සම්පූර්ණයෙන්ම ඉටුකරන තෙක් ඉරානය තුළ සහ අවට පවතිනු ඇත," යනුවෙනි. "කවුරුත් කවදාවත් දැක නැති තරම් විශාල, සහ වඩා හොඳ සහ ශක්තිමත්" ලෙස ඉරානයට පහර දීමට ට්‍රම්ප් තර්ජනය කළේය. "අපගේ ශ්‍රේෂ්ඨ හමුදාව ආයුධ සූදානම් කර ගෙන විවේක ගනිමින් සිටින අතර, ඇත්ත වශයෙන්ම, එහි ඊළඟ ජයග්‍රහණය බලාපොරොත්තුවෙන් සිටී," යනුවෙන් ඔහු තවදුරටත් සඳහන් කළේය.

එක්සත් ජනපදයේ මූලෝපායික අරමුණු වෙනස් වී නැත. වොෂින්ටනය මෙම යුද්ධය දියත් කළේ පර්සියානු ගල්ෆ් සහ හෝමුස් සමුද්‍ර සන්ධිය මත සිය සෘජු පාලනය පැනවීමට සහ 1979 ඉරාන විප්ලවයේ ප්‍රතිවිපාක ආපසු හැරවීමට ය. ඉරානයට එරෙහි යුද්ධය යනු මැද පෙරදිග සිට රුසියාව සහ චීනය සමඟ ගැටුම දක්වා විහිදෙන උත්සන්න වන ගෝලීය යුද්ධයක කොටසකි. මෙමඟින් අලුත් මිලිටරි උත්සන්න කිරීම් සඳහා පීඩනය තීව්‍ර වනු ඇත.

පසුගිය සති දෙකේ සමස්ත අත්දැකීමම එක්සත් ජනපද සහ ජාත්‍යන්තර කම්කරු පන්තියට කරන ලද දැවැන්ත අනතුරු ඇඟවීමක් ලෙස වටහා ගත යුතුය. පැය 24 කට පෙර, ට්‍රම්ප් ඉරාන

 ISSN 3093-6217

ශිෂ්ටාචාරය "අවසන්" කරන බවට ප්‍රතිඥා දෙමින් සිටියේය. එනම්, ගාසා සංහාරයේ ක්‍රමවේදයන් මිලියන 90 ක ජනතාවක් සිටින රටකට මාරු කරන බවට තර්ජනය කළේය. ට්‍රම්ප්ගේ ජන සංහාරක භාෂාව සිතලුවක් නොවේ; **ජන සංහාරය ඇමරිකානු ජනාධිපතිවරයෙකු විසින් නිල වශයෙන් යුද්ධ කිරීමේ ක්‍රමයක් ලෙස පිළිගෙන පැවතිණි.**

හිට්ලර්වාදී වාගාලංකාර සහ ශිෂ්ටාචාරමය විනාශ කිරීමේ තර්ජන භාවිතා කිරීම මගින් ට්‍රම්ප්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදී මැදිහත්වීම් "මානව හිමිකම්" හෝ "ප්‍රජාතන්ත්‍රවාදයේ" නාමයෙන් සිදු කරන බවට කෙරුණු ප්‍රචාරයේ අවසාන ශේෂයන් ද බිඳ දමා ඇත. **බාධක ලෙස ගැනෙන සමස්ත සමාජයන්ම යටත් කර ගැනීම සඳහා ඒවා සුන් කර දැමිය හැකි දේ ලෙස සලකන අපරාධකාරී කතිපයාධිකාරීත්වයක් විසින් එක්සත් ජනපදය මෙහෙයවනු ලබන බව ලෝකයට පෙන්වා දී ඇත.**

**මෙම යුද්ධය නැවැත්වීමට ඇති එකම මාර්ගය කම්කරු පන්තිය පන්ති බලවේගයක් ලෙස ස්වාධීනව බලමුලු ගැන්වීමයි.** ඩිමොක්‍රටික් පක්ෂය හෝ දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කන්ඩායමක් ප්‍රතිපත්තිමය වශයෙන් අධිරාජ්‍යවාදී යුද්ධයට විරුද්ධ නොවනු ඇත. ට්‍රම්ප් සමඟ ඔවුන්ගේ උපායශීලී ආරවුල් කුමක් වුවත්, ඩිමොක්‍රටික් පක්ෂය එකම උපායමාර්ගික අරමුණු, එනම් මැද පෙරදිග ඇමරිකානු ආධිපත්‍යය ආරක්ෂා කරන අතර සියල්ලටම වඩා ධනේශ්වර පාලනයේ සමස්ත ව්‍යුහයටම තර්ජනයක් වන පහළින් මතු වන ව්‍යාපාරයක් මැඩපැවැත්වීමට ක්‍රියා කරයි.

අධිරාජ්‍යවාදී ම්ලේච්ඡත්වයට එරෙහි සටන සඳහා, යුද්ධයට, සමාජ වැඩසටහන් වලට එල්ල වන ප්‍රහාරයට සහ යුද්ධයට, ආඥාදායකත්වයට සහ සමාජ අසමානතාවයට මූල හේතුව වන ධනේශ්වර ක්‍රමයට එරෙහිව, සේවා ස්ථානවල, කර්මාන්ත හරහා සහ දේශසීමා හරහා, ස්වාධීන කම්කරු පන්ති ව්‍යාපාරයක් වර්ධනය කිරීම අවශ්‍ය වේ.

(අවධාරණය පරිවර්තනයේදී එකතු කෙරිණි)

---

සහන ලබා දීමට ටෙහෙරානයට බල කිරීම සහ, බලශක්ති ආනයනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් සඳහා ඉරානයෙන් සහ පුළුල් ගල්ෆ් කලාපයෙන් ලැබෙන ලාභ

# එක්සත් ජනපදය හෝමූස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීමෙන් ප්‍රධාන බලවතුන් අතර ගැටුම් ගැඹුරු වේ

**ජෝර්ඩන් ෂිල්ටන්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අප්‍රේල් *16* වන දින **'US blockade of Strait of Hormuz deepens conflicts between major powers'** යන හිසින් පළවූ ජෝර්ඩන් ෂිල්ටන් විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.

තෙල් මත යැපෙන චීනයේ අවශ්‍යතා වලට වල කැපීමයි.

ඇමරිකානු උප ජනාධිපති ජේ.ඩී. වැන්ස් අඟහරුවාදා පැහැදිලි කළේ, මෙම ඇමරිකානු ආක්‍රමණශීලී යුද්ධය මැද පෙරදිග ප්‍රතිව්‍යුහගත කිරීම අරමුණු කරගත් එකක් බවයි. ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් "කුඩා ගනුදෙනු" ගැන උනන්දුවක් නොදක්වන නමුත් ඉරානය



එක්සත් ජනපද-ඊශ්‍රායල් හමුදා මෙහෙයුම අතරතුර පසුගියදා ගුවන් ප්‍රහාර කිහිපයකින් ඉරානයේ කෙෂ්ම් දූපතේ වරායේ ධීවර තොටුපළට සිදු වූ හානිය. හෝමුස් සමුද්‍ර සන්ධියේ නැව් පසුබිමේ. 2026 අප්‍රේල් 13 වන සඳුදා. [AP ඡායාරූපය/අස්ගාර් බෙෂාරති]

සඳුදා සිට වොෂින්ටනයේ හෝමූස් සමුද්‍ර සන්ධිය අවහිර කිරීම බලාත්මක වූ අතර එය ඉරානයට එරෙහි යුද්ධයේ ප්‍රධාන තීව්‍රවීමක් සනිටුහන් කරයි. ඉරාන වරායන් වෙත සහ ඉන් පිටතට යන සියලුම තෙල් නැව් වල ගමනාගමනය නැවැත්වීමට එක්සත් ජනපද හමුදා දරන උත්සාහයේ අරමුණ වන්නේ, ඇමරිකානු අධිරාජ්‍යවාදය සදහා පුළුල් සමඟ "මහා කේවල් කිරීමක්" සොයන බවත්, එමඟින් එක්සත් ජනපදය ඉරානයට "ආර්ථික වශයෙන් සාමාන්‍ය රටක් ලෙස" සලකනු ඇති බවත් ඔහු උත්සවයකදී ප්‍රකාශ කළේය. ට්‍රම්ප් සහ වැන්ස්ට අවශ්‍ය වන්නේ මිලියන 93 ක ජනතාවක් සිටින, 1979 දී ඉරාන විප්ලවය මගින් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූල්‍ය හා මිලිටරි ආධිපත්‍යය අවසන් කළ මෙම

රට,1979 ට පෙර පැවති තත්ත්වය කරා ආපස්සට හැරවීමටයි.

යුද්ධයේ ආරම්භයේ සිටම ට්‍රම්ප් කළ ප්‍රකාශවලින් පෙනී යන්නේ, ලෝකයේ වැදගත්ම බලශක්ති අපනයන කලාපය කෙරෙහි තම ප්‍රමුඛත්වය සුරක්ෂිත කර ගැනීම සඳහා ඇමරිකානු අධිරාජ්‍යවාදය ඉතාමත් කුරිරු ම්ලේච්ඡත්වයට යොමු වනු ඇති බවයි. ඔහු ඉරානය "ආපසු ගල් යුගයට" ඇද දැමීමට, බෝම්බ හෙලන බවට සපථ කළ අතර, අප්‍රේල් 7 වන දින, "සම්පූර්ණ ශිෂ්ටාචාරයක්" අතුගා දැමිය හැකි බවට වන සමූල ජන සංහාරක (genocidal) තර්ජනයක් කළේය.ඉරානයට එල්ල කරන ලද ඇමරිකානු/ඊශ්‍රායල බෝම්බ හෙලීම අවිචාරවත් ලේ පිපාසිත මනසකින් සිදු කරන ලද අතර, යුද්ධයේ පළමු දිනයේම, ළමුන් 160 කට වැඩි පිරිසක් මරා දැමීමට හේතු වූ බාලිකා පාසලක් විනාශ කිරීමෙන් එය පෙන්නුම් කළේය. පසුගිය සතියේ සටන් විරාමයෙන් පසුව නිකුත් වූ ස්වාධීන විමර්ශන සහ භූමි වාර්තාවලින් හෙළි වූයේ එක්සත් ජනපදය හමුදා ඉලක්කවලට පහර දෙන බව ප්‍රකාශ කළ විට පවා, අවට සිවිල් යටිතල පහසුකම් සහ නේවාසික ගොඩනැගිලිවලට සිදු වූ අනුබද්ධ හානිය (collateral damage) පුළුල් බවයි.

මේ සතියේ ෆොක්ස් බිස්නස් සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවකදී, යුද අපරාධකරු ට්‍රම්ප් ඉරානය ඇමරිකානු අධිරාජ්‍යවාදී නියෝගවලට හිස නැමීම ප්‍රතික්ෂේප කළහොත් තවත් යුද අපරාධ සිදු කරන බවට තර්ජනය කළේය. මාෆියා නායකයෙකු මෙන් කතා කරමින් ට්‍රම්ප් පැවසුවේ, "මම දැන් ඔක්කොම පටන් ගත්තොත්, ඒ රට නැවත ගොඩනැගීමට ඔවුන්ට වසර 20 ක් ගතවනු ඇත. එමෙන්ම අපි ඉවර නැහැ… අපට ඔවුන්ගේ සෑම පාලමක්ම පැයකින් විනාශ කළ හැකියි….. ඔවුන්ගේ සෑම බලාගාරයක්ම"

ට්‍රම්ප් ඇමරිකානු අධිරාජ්‍යවාදය වෙනුවෙන් කතා කරන අතර, එය එක්සත් ජනපදය මුදල් සපයන ලද ෂා රජුගේ මර්දනකාරී ආඥාදායකත්වය පෙරලා දැමූ 1979 විප්ලවය සඳහා ඉරාන ජනතාවට කිසි විටෙකත් සමාව දී නැත. ඔහුගේ උත්සුකය ඉරාන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ගැන තබා ඉරාන "ත්‍රස්තවාදය" ගැනවත් නොවේ. ඒ වෙනුවට, බර්ලිනයේ හම්බෝල්ට් විශ්ව විද්‍යාලයේ මෑතකදී පැවති දේශනයකදී එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සහ ඉරානය අතර ඓතිහාසික සම්බන්ධතාවය සාරාංශ ගත කරන විට ඩේවිඩ් නෝර්ත් පැවසූ පරිදි, ඒ සියල්ල "තෙල්, භූ දේශපාලනික බලපෑම සහ ඇමරිකානු ධනවාදයේ පන්ති අවශ්‍යතා" දක්වා සිඳ වේ.

බ්‍රහස්පතින්දා යුද්ධය පිළිබඳ පැවති සාකච්ඡාවකදී, ෆැසිස්ට් යුද ලේකම් පීට් හෙග්සෙත්, එක්සත් ජනපද හමුදාව "උන්ඩ යලි පුරවමින් සිටින" බවට අනතුරු ඇඟවූ අතර, ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානීන්ගේ සභාපති ඩෑන් කේන් ප්‍රකාශ කළේ "වචනාර්ථයෙන් මොහොතක දැනුම්දීමකින්" හමුදාවට නැවත සටන් ආරම්භ කළ හැකි බවයි. ඉරාන වරාය අවහිර කිරීම ආරම්භ වූ දා සිට නැව් 13 ක් ආපසු හැරී ඇති බව කේන් තවදුරටත් පැවසීය. පසුව එම දිනම මෙම අගය 14 දක්වා වැඩි කරන ලදී.

ලෝකයේ සිව්වන විශාලතම තෙල් සංචිත සහ දෙවන විශාලතම ස්වාභාවික ගෑස් සංචිත ඇති රට වන ඉරානය, එහි තෙල්වලින් සියයට 80 ත් 90 ත් අතර ප්‍රමාණයක් චීනයට අපනයනය කළේය. ට්‍රම්ප් සිය පළමු ධුර කාලය තුළ 2018 දී ටෙහෙරානය සමඟ එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය ලත් න්‍යෂ්ටික ගිවිසුම ඒකපාර්ශ්විකව අවලංගු කළ විට, ඔහු රටට පනවන ලද කුරිරු සම්බාධක හේතුවෙන් මෑත වසරවලදී ඉරාන තෙල් අඩු මිලට ලබා ගැනීමෙන් බීජිනය ප්‍රතිලාභ ලබා ඇත. 2021 දී, චීනය ඉරානය සමඟ වසර 25 ක මූලෝපායික හවුල්කාරිත්වයක් අත්සන් කළ අතර එයට චීන ආර්ථිකය සඳහා ඩොලර් බිලියන 400 ක තෙල් සැපයුමට හුවමාරුවක් ලෙස ඉරාන යටිතල පහසුකම් සඳහා ප්‍රධාන ආයෝජන ඇතුළත් විය. වොෂින්ටනය දැන් බලාපොරොත්තු වන්නේ තම සම්බාධක මගින් ඉටු කළ නොහැකි දේ ම්ලේච්ඡ මිලිටරි බලයෙන් ලබා ගත හැකි බවයි. නමුත් මෙම යුද්ධයේ පළමු සති හය තුළ පෙන්නුම් කර ඇත්තේ ලෝකයේ බලවත්ම හමුදාවට පවා ඇමරිකානු අධිරාජ්‍යවාදයේ දිග්ගැස්සුනු පරපත් වීමේ බලපෑම ජය ගත නොහැකි බවයි.

යුද්ධයට පෙර චීනය ඉරානයෙන් දිනකට තෙල් බැරල් මිලියන 1.4 ක් සහ සමස්තයක් ලෙස ගල්ෆ් කලාපයෙන් දිනකට බැරල් මිලියන 5 කට වඩා ලබා ගනිමින් සිටියේය. එක්සත් ජනපද අවහිරය අනෙකුත් ගල්ෆ් රාජ්‍යයන්ගෙන් චීනයට සිදු කරන අපනයනය කිරීම් වලට සෘජුවම බාධාවක් නොවුනත්, කලාපයේ නිෂ්පාදනය යුද්ධයෙන් තියුනු ලෙස පීඩාවට පත්ව ඇති අතර එය ගෝලීය ආර්ථික අවුල් කිරීමට තර්ජනය කරයි. වාර්තා වන පරිදි චීනයේ මාස 5 ක ඉල්ලුම සපුරාලීමට හැකි තෙල් සංචිත ඇති නමුත්, සැපයුමේ දිගුකාලීන අඩුවීම් එහි දැනටමත් බිඳෙනසුලු ආර්ථිකය බරපතල ලෙස දුර්වල කළ හැකිය. එපමණක් නොව, මෙම සතියේ IMF වාර්තාවකින් මතු කරන ලද ගෝලීය ආර්ථික අවපාතයක අපේක්ෂාව, ආර්ථික වර්ධනය පවත්වා ගැනීම සඳහා බීජිංහි ස්ටැලින්වාදී තන්ත්‍රය විශ්වාසය තබන චීන අපනයන සඳහා ක්ෂීන වන වෙළඳපොළක් අදහස් කරනු ඇත.

බදාදා බීජිං සංචාරයකදී රුසියානු විදේශ අමාත්‍ය සර්ජි ලැව්රොව් ප්‍රකාශ කළේ මැදපෙරදිග යුද්ධය හේතුවෙන් චීනයට ඇති වන ඕනෑම තෙල් හිඟයක්, මොස්කව් මගින් පියවා ගත හැකි බවයි. කෙසේ වෙතත්, මෙම ප්‍රකාශය සැක සහිත ය. රුසියාව සහ චීනය අතර නල මාර්ග දැනටමත් සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන බව වාර්තා වන අතර, චීනයට ළඟා වන දිනකට තෙල් බැරල් මිලියන 2 ක් පමණ වන තෙල් පරිමාව සැලකිය යුතු ලෙස වැඩි කිරීමට අවශ්‍ය තෙල් ප්‍රවාහන යාත්‍රා රුසියාවට නොමැත. ඉරාන තෙල් අපනයන සම්පූර්ණයෙන්ම පියවා ගැනීමට සහ අනෙකුත් ගල්ෆ් රටවලින් ලැබෙන තෙල් වල පහත වැටීමෙන්

කොටසක් හෝ ආවරණය කිරීම සඳහා, රුසියාව චීනයට කරන වර්තමාන අපනයන, දෙගුණයකට වඩා වැඩි කිරීමට සිදුවනු ඇත.

දෙවන ලෝක යුද්ධ සමයේ නාසි පාලන තන්ත්‍රයෙන් පසු ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අසමසම ආක්‍රමණශීලීත්වය සහ අපරාධකාරීත්වයට මුහුණ දී සිටින බීජිනය, සියලු රාජ්‍යයන්ගේ අවශ්‍යතාවලට ගරු කරන ස්ථාවර “බහු-ධ්‍රැවීය ලෝකයක” අපේක්ෂාව ඉදිරිපත් කරමින් එක්සත් ජනපද අවහිරයට ප්‍රතිචාර දක්වා ඇත. ෂින්හුවා වාර්තාවකට අනුව, බීජිනය සහ මොස්කව් “බහුපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කළ යුතු අතර, බහුපාර්ශ්විකත්වය ස්ථිරව ආරක්ෂා කර ක්‍රියාත්මක කළ යුතුය. එක්සත් ජාතීන්ගේ අධිකාරය සහ ජීව ශක්තිය පුනර්ජීවනය කිරීමට අත්වැල් බැඳ ගත යුතු අතර, ෂැංහයි සහයෝගිතා සංවිධානයේ (Shanghai Cooperation Organization) සහ බ්‍රික්ස් රටවල රාමු තුළ සමීප සම්බන්ධීකරණය හා සහයෝගීතාවයේ නිරත විය යුතුය. ජාත්‍යන්තර පිළිවෙල වඩාත් සාධාරණ හා යුක්තිසහගත දිශාවකට සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කළ යුතු” බව ෂී ජින්පින් ලැව්රොව්ට පැවසීය.

සෝවියට් ස්ටැලින්වාදී නිලධරයේ “සාමකාමී සහජීවනය” පිළිබඳ ප්‍රතිපත්තියේ මෙම නවීන අනුවාදය, 20 වන සියවසේදී, ස්ටැලින්වාදීන් රුසියානු ධනවාදය අධිරාජ්‍යවාදී ලෝක පර්යායට ඒකාබද්ධ කිරීමේ අසාර්ථක උත්සාහයක දී සෝවියට් සංගමය දියකර හැරීමට හේතු වූ විට, ලෝක ධනවාදයේ යථාර්ථයන් තුළ එයට තිබූ පදනමට වඩා අඩු පදනමක් අද තිබේ. ‘වෙන්ඩ-ඒකාධිපති’ (ඒකාධිපති වීමට නියමිත) ට්‍රම්ප් යටතේ, ඇමරිකානු අධිරාජ්‍යවාදය එහි වේගවත් වන ආර්ථික පරිහානිය මධ්‍යයේ එහි ගෝලීය ආධිපත්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා තුන්වන ලෝක යුද්ධයක් දියත් කිරීමට සම්පූර්ණයෙන්ම කැපවී සිටී. **ඉරාන ශිෂ්ටාචාරය අතුගා දැමීමට ට්‍රම්ප්ගේ ලේ කැටි ගැස්සෙන තර්ජන සාක්ෂි දරන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදය තමන්ගේ වියදමින් “බහුපාර්ශ්විකත්වයේ” ධජය යටතේ චීන සහ රුසියානු බලපෑම පුළුල් කිරීම සාමකාමීව පිළිගන්නේ නැති බවයි.**

වසර ආරම්භයේ සිට ට්‍රම්ප්ගේ ක්‍රියාමාර්ගවලින් නිසැකවම පැහැදිලි වී ඇත්තේ ඔහුගේ අවසාන ඉලක්කය චීනයේ නැගීම අවහිර කිරීම බවයි. චීනයයේ ප්‍රධාන තෙල් සැපයුම්කරුවෙකු වන වෙනිසියුලාව මත මිලිටරි ප්‍රහාරයක් දියත් කළේ, එහි ජනාධිපතිවරයා අල්ලා ගැනීමට සහ රටේ බලශක්ති සංචිත ඇමරිකානු ප්‍රාග්ධනයට විවෘත කිරීම උදෙසා එක්සත් ජනපද රූකඩ පාලනයක් ස්ථාපිත කිරීම සඳහා ය. ඉරානයට එරෙහිව මෙහෙයුමක් පහසුවෙන් කළ හැකි බවට විශ්වාස කරමින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විනාශකාරීව වැරදි ලෙස ගණනය කළ ද, කෙසේ වෙතත් එය සමස්ත මැද පෙරදිග පුරා චීන ආර්ථික සබඳතා කඩාකප්පල් කිරීමේ ඉලක්කය හඹා යමින් සිටී. **මෙය යුද්ධය අඛණ්ඩව පවත්වාගෙන යාමේ ස්වරූපයක් ගත්තද නැතහොත් ඉරානය සමඟ “මහා කේවල් කිරීමක” ස්වරූපයක් ගත්තද, ධනවාදය යටතේ විසඳිය නොහැකි මෙම ගැටුමේ වෛෂයික තර්කනය න්‍යෂ්ටික සන්නද්ධ බලවතුන් අතර විනාශකාරී මිලිටරි ගැටුමකි. නෝර්ත් ඔහුගේ බර්ලින් දේශනයේදී නිරීක්ෂණය කළ පරිදි,**

“(මෙහිදී), ඉතිහාසය තමන් විසින්ම පනවන ලද ඓතිහාසික සමාන්තරය වන්නේ 1991 ගල්ෆ් යුද්ධය හෝ 2003 ඉරාක ආක්‍රමණය නොව, 1914 අගෝස්තු මාසයයි. පළමු ලෝක යුද්ධය බෝල්කන් කලාපයේ කලාපීය ගැටුමක් ලෙස ආරම්භ වූ අතර, සන්ධාන වල තර්කනය, අධිරාජ්‍ය එදිරිවාදිකම් සහ වැරදි ගනන් බැලීම් හරහා අධිරාජ්‍ය හතරක් විනාශ කර මිලියන 20 ක ජනතාවක් මරා දැමූ ගෝලීය ව්‍යසනයක් දක්වා ව්‍යාප්ත විය.”

මෙයින් ගැලවිය හැකි එකම මග වන්නේ ධනේශ්වර ලාභ ක්‍රමය අවසන් කර සමාජවාදය ස්ථාපිත කිරීම සඳහා කම්කරු පන්තිය විසින් මෙහෙයවනු ලබන ජාත්‍යන්තර යුද විරෝධී ව්‍යාපාරයක් ගොඩනැගීමයි. ඉරානයේ සහ මැද පෙරදිග පුරා කම්කරුවන් අධිරාජ්‍යවාදී ආක්‍රමණයට එරෙහි ඔවුන්ගේ අරගල, නිමක් නැති යුද්ධ සහ මූල්‍ය කතිපයාධිකාරයේ පොහොසත් කිරීම සඳහා තම ජීවන තත්වයන් මත දරුණු ප්‍රහාරයකට මුහුණ දෙන උතුරු ඇමරිකාවේ සහ යුරෝපයේ අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානවල කම්කරු පන්තිය සමඟ සහ චීනයේ සහ රුසියාවේ ධනවාදී-පුනස්ථාපන පාලන තන්ත්‍ර දෙක, අර්බුද- ග්‍රස්ථ ධනවාදය තුළට තමන්ව ගලපාගෙන ස්ථානගත කර ගැනීමට දරන උත්සාහයන් සමඟ ගැටෙන කම්කරුවන් සමඟ ඒකාබද්ධ කළ යුතුය. මෙය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් සටන් වදින වැඩ පිළිවෙළයි.
(අවධාරණය පරිවර්තනයේදී එකතු කෙරිණි)

---

අසන්න The Socialist World YouTube Channel - Podcasts









 ISSN 3093-6217

# ප්‍රමාද වැඩි වීමට පෙර අත්‍යාසන්න සමූහ ජනසංහාරය නවත්වනු! ඉරාන ශිෂ්ටාචාරය අතුගා දැමීමේ ට්‍රම්ප්ගේ තර්ජනය හෙළා දකිනු!

**theSocialist.lk හි කර්තෘ මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) විසින් නිකුත් කරන ලද හදිසි ප්‍රකාශය**

මේ 2026 අප්‍රේල් 7 දින රාත්‍රී 10:32 theSocialist.lk හි පළ කෙරුනු ප්‍රකාශයේ සිංහල පරිවර්තනයයි.

අද, 2026 අප්‍රේල් 7 වන දින, එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් Truth Social හි පළ කළේ: "අද රාත්‍රියේ මුළු ශිෂ්ටාචාරයක්ම මිය යනු ඇත, නැවත කිසිදා ආපසු ගෙන ඒමට නොහැකි වනු ඇත. මට එය සිදුවීමට අවශ්‍ය නැත, නමුත් එය බොහෝ විට සිදුවනු ඇත."

මෙය හුදෙක් පුහු දේශපාලනික වහසි බස් දෙඩවීමක් නොවේ. මෙය, න්‍යෂ්ටික අවි දහස් ගණනක් ඇති සහ දැනටමත් දින හතළිහක් තිස්සේ ඉරානයට බෝම්බ හෙලන, ඉතිහාසයේ වඩාත්ම බලවත් ලෙස සන්නද්ධ මිලිටරි බලයක රාජ්‍ය නායකයා විසින් සමූල ජන ඝාතක අභිප්‍රාය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමයි.



ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් 2026 අප්‍රේල් 6 වන සඳුදා වොෂින්ටනයේ ධවල මන්දිරයේ ජේම්ස් බ්‍රැඩි මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදීන් සමඟ කතා කරයි. [AP ඡායාරූපය/මාර්ක් ෂීෆෙල්බයින්]

ලෝක සමාජවාදී වෙබ් අඩවිය අද එහි හදිසි ඉදිරි දර්ශනයෙන් ප්‍රකාශ කළ පරිදි: "ට්‍රම්ප් පැවසූ සෑම වචනයක්ම එක්සත් ජනපද ආණ්ඩුව හිට්ලර් පරිමාණයේ අපරාධයකට ගැට ගසයි. නාසි නායකයින් දොරවල් වසාගෙන සාකච්ඡා කළ දේ ඔහු විවෘතව කියයි." ට්‍රම්ප් දැනටමත් සෑම බලාගාරයක්ම, සෑම පාලමක්ම, සෑම මුහුදු ජලයෙන් ලවණ ඉවත් කිරීමේ පහසුකමක්ම – මිලියන 93 ක ජනතාවක් සඳහා ශිෂ්ට සම්පන්න ජීවිතයේ සමස්ත යටිතල පහසුකමක්ම – විනාශ කරන බවට තර්ජනය කර තිබේ. මෙය "පැය හතරක කාලයක් තුළ" ඉටු කරන බව ඔහු ප්‍රකාශ කර තිබේ. මෙය යුද අපරාධවලට අයත් දැයි වාර්තාකරුවෙකු ඔහුගෙන් විමසීය. ඔහුගේ පිළිතුර: "නැහැ, කොහෙත්ම නැහැ."

ඉරානය මානව ඉතිහාසයේ පැරණිතම හා ගැඹුරුතම ශිෂ්ටාචාරයන් ගෙන් එකක උරුමකරු වේ. යුද්ධයේ පළමු දිනයේ දී Shajareh Tayyebeh බාලිකා පාසලට එල්ල වූ ඇමරිකානු මිසයිල ප්‍රහාරයකින් මියගිය ළමුන් 168 දෙනෙකු ඇතුළුව එහි සිවිල් වැසියන් දහස් ගණනක් දැනටමත් ඝාතනය කර ඇත. රෝහල්, විශ්ව විද්‍යාල, නේවාසික ප්‍රදේශ සහ පාසල් වලට ක්‍රමානුකූලව බෝම්බ හෙලා ඇත. ලෝක සමාජවාදී වෙබ් අඩවිය අනතුරු අඟවා ඇති පරිදි, ප්‍රහාරක උත්සන්න කිරීමේ තර්කනය නොවැළැක්විය හැකිය: තීව්‍ර කරන ලද බෝම්බ හෙලීමේ සිට භූමි ආක්‍රමණය දක්වා, ඉරාන නගර අත්පත් කර ගැනීම දක්වා සහ අවසානයේ – වැඩිවන ඇමරිකානු හානි සහ හමුදා අසාර්ථකත්වය හමුවේ – න්‍යෂ්ටික අවි වෙත යොමු වීම දක්වා එය උත්සන්න වනු ඇත.

මෙය කල්පිතයක් නොවේ. ධනේශ්වර දේශපාලන ක්‍රමය තුළ කිසිදු බරපතල බලවේගයක් එයට කිසිදු තිරිංගයක් නොයොදා, සතියක් පාසා උත්සන්න වෙමින් දින හතළිහක් තිස්සේ සිදුවෙමින් පවතින යුද්ධයක ගමන් පථය මෙයයි.

ඩොලර් බිලියන 839 ක ආරක්ෂක අයවැය සඳහා තමන්ගේ ඡන්දයෙන් යුද්ධයට අරමුදල් සැපයූ එක්සත් ජනපද ඩිමොක්‍රටික් පක්ෂය දැන් ට්‍රම්ප්ව "පිස්සෙක්" සහ " සිහි විකල් වූවෙක්" ලෙස හඳුන්වයි. නමුත් එක ඩිමොක්‍රටිකයෙකු වත් යුද්ධය නැවැත්වීම සඳහා සංයුක්ත ක්‍රියාමාර්ගයක් යෝජනා කර නැත. ඔවුන් ඊට හවුල්කරුවන් ය. යුද්ධයට එරෙහි ඕනෑම සැබෑ මහජන බලමුලු ගැන්වීමක් යුද්ධයෙන් නතර නොවනු ඇතැයි ඔවුන් භීතියට පත්ව සිටිති. එය

ධනය බෙදා හැරීම, මූල්‍ය කතිපයාධිකාරයේ බලය සහ පක්ෂ දෙකම මගින් ආරක්ෂා කරන සමාජ ක්‍රමය පිළිබඳ සමස්ත ප්‍රශ්නයම මතු කරනු ඇත.

යුරෝපයේ පාර්ලිමේන්තු, ඕස්ට්‍රේලියාවේ, කැනඩාවේ සහ එක්සත් රාජධානියේ ආණ්ඩු – මේ සියල්ලන්ම මෙම අපරාධයට සම්බන්ධය. ඕස්ට්‍රේලියාව රහසිගතව SAS කමාන්ඩෝ භටයින්, Wedgetail සටන් කළමනාකරණ ගුවන් යානා සහ එහි Pine Gap බුද්ධි මධ්‍යස්ථානය යුද්ධයට යොදවා ඇත. බ්‍රිතාන්‍යය හෝමුස් සමුළුව පවත්වයි. ජර්මනිය නැවත සන්නද්ධ වෙමින් සිටී. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය පක්ෂාඝාත වී ඇත. ජාත්‍යන්තර නීතිය සුන් කර ඇත.

ධනේශ්වර රාජ්‍ය පද්ධතියට මෙම යුද්ධය නැවැත්විය නොහැකි බව කිසිදු සැකයකින් තොරව ඔප්පු කර ඇත. ජාත්‍යන්තර කම්කරු පන්තියට පමණක් එය කළ හැකිය.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමඟ පෙළගැසී සිටින theSocialist.lk සහ ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA), කම්කරුවන්, තරුණයින් සහ මෙම සාපරාධී යුද්ධයට විරුද්ධ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ:

**වැඩ වර්ජනය**: එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, ජර්මනිය සහ ලොව පුරා සිටින කම්කරුවන් යුද යන්ත්‍රය ක්‍රියාත්මක වීමට ඇති මාධ්‍යයන් අවහිර කිරීම සඳහා – වරාය, ගුවන්තොටුපළ, සැපයුම් මධ්‍යස්ථාන, ආයුධ නිෂ්පාදන කම්හල් සහ ප්‍රවාහන ජාලයන් – වහාම කාර්මික ක්‍රියාමාර්ග ගත යුතුය. AFL-CIO, UAW, TUC සහ සෑම ප්‍රධාන වෘත්තීය සමිති සම්මේලනයක්ම සාපරාධී නිහඬතාවයක් පවත්වා ඇත. මෙම යුද්ධයට ආයුධ, ඉන්ධන සහ සැපයුම් ගලායාම නැවැත්වීම සඳහා කම්කරුවන් නිලධරයෙන් ස්වාධීනව ඔවුන්ගේ සාමාන්‍ය කම්කරු කමිටු හරහා ක්‍රියා කළ යුතුය.

**අත්පත් කර ගැනීම**: කම්කරුවන් සහ තරුණයින් සේවා ස්ථාන, විශ්ව විද්‍යාල පරිශ්‍ර සහ පොදු අවකාශයන් අත්පත් කර ගත යුතුය –ඒ, යුද්ධයේ සේවකයින් බව ඔප්පු කර ඇති ආණ්ඩුවලට කන්නලව් කිරීමට නොව, කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන බලය තහවුරු කිරීමට ය. මාර්තු 28 වන දින එක්සත් ජනපදයේ පමණක් පෙළපාළි ගිය මිලියන අටක මහජන ව්‍යාපාරය, විරෝධතා ව්‍යාපාරයක සිට, වැඩසටහනක්, උපාය මාර්ගයක් සහ නායකත්වයක් සහිත සංවිධානාත්මක දේශපාලන බලවේගයක් බවට පරිවර්තනය කළ යුතුය.

**ජාත්‍යන්තරව සංවිධානය වීම**: ඉරානයට එරෙහි යුද්ධය ජාතික ප්‍රශ්නයක් නොවේ. එය ලෝක ප්‍රශ්නයකි. ශ්‍රී ලංකාවේ, දකුණු කොරියාවේ, ජපානයේ – බෝම්බ හෙළන විට දී පවා තෙල් සැපයුම් සුරක්ෂිත කිරීම සඳහා ඉරානය සමඟ වෙනම ගිවිසුම් ගහ ගන්නා ආණ්ඩු පවතින මෙම රටවල – කම්කරුවෝ අරගලයට එක්විය යුතුය. "වසර ගණනාවක් ඉදිරියට එක්සත් ජනපදයට සහ එහි සහචරයින්ට කලාපයේ තෙල් හා ගෑස් අහිමි කරන" බවට IRGC අනතුරු ඇඟවීම, ශිෂ්ටාචාරමය පරිමාණයේ ආර්ථික හා මිලිටරි ව්‍යසනයකට ලෝකය කෙතරම් සමීපව සිටිනවාද යන්න පිළිබඳ මිනුමක් වේ. එකම පිළිතුර වන්නේ කම්කරු ක්‍රියාකාරී කමිටුවල ජාත්‍යන්තර සන්ධානය (IWA-RFC) හරහා සංවිධානය වන ජාත්‍යන්තර කම්කරු පන්ති සහයෝගීතාවයයි.

අද ට්‍රම්ප්ගේ තර්ජනය එහි සැබෑ අරුතින් තේරුම් ගත යුතුය: එය ඉරානයට එරෙහිව පමණක් නොව, මානව ශිෂ්ටාචාරයේ සියලු සමුච්චිත ජයග්‍රහණවලට එරෙහිව – ජාත්‍යන්තර නීතියට එරෙහිව, සිවිල් යටිතල පහසුකම් ඉලක්ක කිරීම තහනම් කිරීමට එරෙහිව, දෙවන ලෝක යුද්ධයේ භීෂණයෙන් හා නාසි සමූලඝාතනයෙන් පසුව සංග්‍රහ කරන ලද මානව වර්ගයාගේ මූලික සම්මතයන්ට එරෙහිව – යුද්ධ ප්‍රකාශ කිරීමකි. ඩේවිඩ් නෝර්ත් නියුරම්බර්ග් යුක්තියේ මාලිගාව (Nuremberg Palace of Justice) ඉදිරිපිට දී ප්‍රකාශ කළ පරිදි, මෙම යුද්ධය නියුරම්බර්ග් නඩු විභාගයේදී ඉහළම ජාත්‍යන්තර අපරාධය වන "සාමයට එරෙහි අපරාධය" සඳහා ස්ථාපිත කර ඇති සෑම නීතිමය සහ දේශපාලන නිර්ණායකයක්ම සපුරාලයි.

අද, 2026 අප්‍රේල් 7 වන දින ඉරාන ශිෂ්ටාචාරය විනාශ වූ දිනය බවට පත් වුවහොත්, එය ධනේශ්වර ලෝක පර්යාය මනුෂ්‍යත්වය ඉදිරියේ තමන්ගේම මරණ වරෙන්තුව අත්සන් කරන දිනය ද වනු ඇත. ඒ වෙනුවට එය ජාත්‍යන්තර කම්කරු පන්තිය මෙසේ කීමට නැගී සිටින දිනය බවට පත්විය යුතුය: අපගේ නාමයෙන් නොවේ. අපගේ ශ්‍රමය නිසා නොවේ. අපගේ නිහඬතාවය නිසා නොවේ.

මෙම ප්‍රතිරෝධය සංවිධානය කරන්නේ ජාත්‍යන්තර කමිටුවේ සමාජවාදී සමානතා පක්ෂ (සසප) ශාඛාවන් විසිනි. ශ්‍රී ලංකාවේ, දකුණු ආසියාවේ සහ ජාත්‍යන්තරව සිටින සියලුම කම්කරුවන්ට, තරුණයින්ට සහ සමාජවාදී මනසක් ඇති පුද්ගලයින්ට ඒවා සමඟ සම්බන්ධ වන ලෙස අපි ඉල්ලා සිටිමු.

ඉරානයට එරෙහි එක්සත් ජනපද-ඊශ්‍රායල යුද්ධය වහාම, කොන්දේසි විරහිතව නතර කරන ලෙස ඉල්ලා සිටින්න.

මැද පෙරදිගින් සියලුම අධිරාජ්‍යවාදී බලවේග ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටින්න.

කම්කරු ක්‍රියාකාරී කමිටු ගොඩනඟන්න. වැඩ වර්ජනය කරන්න. සංවිධානය වන්න. සමාජවාදය සඳහා සටන් කරන්න.

**ඉරානය, පලස්තීනය, ලෙබනනය, කියුබාව යන රටවල ජනතාව සමඟ සහයෝගීතාවය – ජාත්‍යන්තර කම්කරු පන්තියේ එකමුතුව!**

**ඉරානයට අත නොතබනු – අධිරාජ්‍යවාදී යුද්ධය නවත්වනු!**

**තවත් ජන සංහාරයක් එපා – ට්‍රම්ප්ගේ යුද යන්ත්‍රය නවත්වනු!**

**යුද්ධයට හා කප්පාදුවට එරෙහිව කම්කරු බලය!**

**යුද්ධයට වරායන් වසා දමනු – කම්කරුවනි එක්වව්!**

**යුද්ධයට එක සතයක්වත් නොදෙනු – රෝහල්, පාසල්, රැකියා සඳහා අරමුදල් සපයනු!**

**අධිරාජ්‍යවාදී සහ සයොන්වාදී හමුදා මැද පෙරදිගින් පිටවනු!**

**යුද අපරාධකරුවන් නවත්වනු – අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයින්ට එරෙහිව නියුරම්බර්ග්!**

රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ නිර්මාතෘ වන තියඩෝර් රූස්වෙල්ට් පවා ලැජ්ජාවට පත් කරන ආකාරයේ මැර කල්ලිවාදයකිනි.

ජනවාරි 29 වන දින ට්‍රම්ප් විසින් කියුබාව "ජාතික හදිසි අවස්ථාවක්" ලෙස නම් කිරීමෙන් සහ මෙම දූපත් රාජ්‍යයට එරෙහිව සම්පූර්ණ බලශක්ති සම්බාධක පැනවීමෙන් පසු හවානා විසින් ලබා දුන් ප්‍රධාන අත් හැරීම් මාලාවකින් පසුව මෙම උද්දච්ච ප්‍රකාශ නිකුත් විය.

සති කිහිපයක් ඇතුළත, කියුබානු රජය විසින් පෞද්ගලික ව්‍යාපාර පුළුල් කරමින් සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ට ඉඩ සලසමින් පුළුල් ආර්ථික "ප්‍රතිසංස්කරණ" නිවේදනය කර ඇත. කියුබානු-ඇමරිකානු ත්‍රස්තවාදීන්ගේ සන්නද්ධ ආක්‍රමණයක් මෙය ෆිදෙල් කැස්ත්‍රෝ විසින් පිටුවහල් ප්‍රාග්ධනය සඳහා දීර්ඝ කාලයක් තිස්සේ පනවා තිබූ තහනමේ ඓතිහාසික ආපසු හැරීමකි. ආක්‍රමණ, ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර සහ ඝාතන උත්සාහයන් හරහා අර්ධ යටත් විජිත යුගය නැවත ඇති කිරීමට උත්සාහ කළ ස්ථරවලට එරෙහිව ආරක්ෂාවක් ලෙස මෙය යුක්ති සහගත කරන ලදී.

එහෙත් මෙය පාලන තන්ත්‍ර වෙනසක් සඳහා ධවල මන්දිර බල කිරීම් සන්සුන් කිරීමට කිසිවක් කර නැත. අඟහරුවාදා ඕවල් කාර්යාලයේ ට්‍රම්ප් අසල වාඩි වී සිටි රාජ්‍ය ලේකම් මාර්කෝ රුබියෝ, හවානාහි ව්‍යාපාරික-ගැති පියවර ප්‍රමාණවත් නොවන බව පවසා ප්‍රතික්ෂේප කළේය: "ඔවුන්ට එය නිවැරදි කළ නොහැක. එබැවින් ඔවුන් බරපතල ලෙස වෙනස් විය යුතුය. ඔවුන් ඊයේ නිවේදනය කළ දෙය ප්‍රමාණවත්

# කියුබාවට සහ ලතින් ඇමරිකාවට එරෙහි වොෂින්ටනයේ ප්‍රහාරය: 20 වන සියවස අහෝසි කිරීමේ ධනවාදී ධාවනයේ මුඛ්‍ය පෙරමුණක්

**අන්ඩ්‍රියා ලෝබෝ** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* මාර්තු *18* වන දින *"**Washington's assault on Cuba and Latin America: A key front in the capitalist drive to abolish the 20th century**"* යන හිසින් පළවූ අන්ඩ්‍රියා ලෝබෝ විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

සඳුදා දිවයින (කියුබාව) පුරා සම්පූර්ණ විදුලි කප්පාදුවකට සමගාමීව, එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් වාර්තාකරුවන්ට පුරසාරම් දෙඩුවේ, "කියුබාව අල්ලා ගැනීමේ ගෞරවය මට ලැබෙනු ඇතැයි මම විශ්වාස කරවා. ඒක ලොකු ගෞරවයක්",යනුවෙනි.

"මම ඒක නිදහස් කළත්, ලබා ගත්තත්, මට හිතෙනවා ඒකෙන් මට ඕන දෙයක් කරන්න පුළුවන් කියලා," ඔහු එය පැවසුවේ, "බිග් ස්ටික්" ( Big Stick) විමර්ශනය කිරීමට උදව් කිරීම සඳහා දිවයිනට FBI "විශේෂඥයින්"ට ආරාධනා කර තිබේ. මියාමි හි එක්සත් ජනපද සංගත සහ පිටුවහල් "ගුසානෝ (gusano)"ධනපතියන් හා සමග සබඳකම් සඳහා විවෘතව තැත් කර ඇත. එමෙන්ම ඉන්ධන අවහිර කිරීම සහ "ආරක්ෂක සහයෝගීතාව" සම්බන්ධයෙන් ට්‍රම්ප් පරිපාලනය සමඟ අඛණ්ඩ සාකච්ඡා තහවුරු කර ඇත.

බදාදා දින, කියුබාවේ ජනාධිපති මිගෙල් ඩියාස්-කැනල් විසින් "දිනපතාම පාහේ" ට්‍රම්ප් සිදු කරනු ලබන තර්ජන හෙළා දුටු අතර, ඊට "නොනැමෙන ප්‍රතිරෝධය" ප්‍රකාශ කළ නමුත් ඔහුගේ පරිපාලනයේ ක්‍රියාමාර්ග යටත් වීමක් පෙන්නුම් කරයි. නියෝජ්‍ය අගමැති ඔස්කාර් පෙරෙස්-ඔලිවා එන්බීසී ප්‍රවෘත්ති වෙත පැවසුවේ "ඇමරිකානු සමාගම් සමඟ සහ එක්සත් ජනපදයේ වෙසෙන කියුබානුවන් සහ ඔවුන්ගේ පරම්පරාවන් සමඟ ද නම්‍යශීලී වාණිජ සම්බන්ධතාවයක් පැවැත්වීමට කියුබාව විවෘත" බවයි.

තරම් නාටකාකාර නොවේ. එය එය නිවැරදි කිරීමට සමත් නැත."

කැස්ත්‍රෝ පවුල දිවයිනේ අඛණ්ඩව රැඳී සිටීම ගැනත්, ඩයස්-කැනල් සම්බන්ධයෙන් "ඉවත් කිරීමේ" පියවරක් ගැනීම සහ "වරාය, බලශක්තිය සහ සංචාරක ව්‍යාපාරය සම්බන්ධ ගණුදෙනු" – වෙනත් වචන වලින් කිවහොත්, එකඟතාවයට එළඹුණු නැවත-යටත්විජිතකරණ පැකේජයක්– පිළිබඳව ට්‍රම්ප්ගේ කණ්ඩායම සාකච්ඡා කරමින් සිටින බව USA Today වාර්තා කර ඇත.

එක්සත් ජනපදය කියුබාව වටලෑම, අර්ධගෝලයේ සෑම රටකම ඉරණම සෘජුවම නියම කිරීමට සහ ඔවුන්ගේ සියලු සම්පත් අත්පත් කර ගැනීමට වොෂින්ටනයට ඇති අයිතිය තහවුරු කරන මොන්රෝ මූලධර්මයේ ට්‍රම්ප්ගේ "ට්‍රම්ප් අනුෂංගය" (Trump Corollary) යටතේ වන පුළුල් අධිරාජ්‍යවාදී ප්‍රහාරයක සංරචකයකි.

ඇමරිකානු මහජනතාවට එය අලෙවි කරන ආකාරය පිළිබඳ විවාදවලට අමතරව, පාලන තන්ත්‍රයන් වෙනස් කිරීමේ ජන සංහාරක මෙහෙයුමට පක්ෂ දෙකම සහ සංගත (large company) මාධ්‍ය සහාය දක්වයි. පක්ෂයේ "ප්‍රගතිශීලී" පාර්ශ්වයේ කොටසක් ලෙස සැලකෙන ඩිමොක්‍රටික් කොන්ග්‍රස් සභික රෝ ඛන්නා, X සමාජ මාධ්‍යය තුළ එයට අනුමැතිය දෙමින් "(එවැනි) ගිවිසුමක් ඇමරිකානු සහ කියුබානු ව්‍යවසායකයින්ට කියුබාවේ ආයෝජනය කිරීමට සහ කියුබාව ආර්ථික වශයෙන් යථා තත්ත්වයට පත් කිරීමට සහ නවීකරණය කිරීමට උපකාරී වනු ඇත," යනුවෙන් ලිව්වේය.

මේ මස මුලදී මියාමි හි පැවති ෂීල්ඩ් ඔෆ් ද ඇමරිකාස් (Shield of the Americas) සමුළුවේදී, ට්‍රම්ප් විසින් ආර්ජන්ටිනාව, ඉක්වදෝරය, පැරගුවේ, චිලී සහ අර්ධගෝලයේ වෙනත් තැන්වල අන්ත දක්ෂිණාංශික පාලන තන්ත්‍ර සහ සහචරයින් පොදු වැඩසටහනක් සඳහා එක් කරන ලදී. එමගින් හමුදාකරණය, මහජන මර්දනය සහ ජීවන තත්වයන්ට සහ සමාජ වැඩසටහන් වලට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කිරීම අරමුණු කර ගෙන ඇත.

ට්‍රම්ප් ෆැසිස්ට්වාදී කලාපීය නායකයින්ට පැවසුවේ "කියුබාව එහි ජීවිතයේ අවසාන මොහොතේ පසුවෙන," බවයි. ඊට ඔවුහු අත්පොළසන් දෙමින් ප්‍රතිචාර දැක්වූහ.

"මත්ද්‍රව්‍ය-ත්‍රස්තවාදීන්ට" එරෙහිව සටන් කරන බව පවසමින්, "සම්පූර්ණ සමූලඝාතන මෙහෙයුම" යටතේ එක්සත් ජනපදය ඉක්වදෝරයට හමුදා යොදවා FBI සහ හමුදා කාර්යාල විවෘත කර ඇත. මෙම ඒකාබද්ධ ප්‍රහාරයෙන් ගොවීන්ගේ නිවාස ගිනි තැබීම, ග්‍රාමීය ප්‍රදේශවලට බෝම්බ හෙලීම සහ කම්කරුවන්ට වධහිංසා පැමිණවීම පමණක් නොව, ඉක්වදෝරයෙන් දියත් කරන ලද ගුවන් ප්‍රහාරයකින් තම භූමියේ පුද්ගලයින් 27 දෙනෙකු ඝාතනය වීම කොලොම්බියාව විසින් හෙළා දැකීමද සිදුවුණි. මේ අතර, ඉක්වදෝර අධිකරණ විසින් ප්‍රධාන ධනේශ්වර විරුද්ධ පක්ෂය වන රෆායෙල් කොරියාගේ "පුරවැසි විප්ලවය ව්‍යාපාරය" අත්හිටුවා තිබේ.

පෙන්ටගනයේ දක්ෂිණ අධිකාරිය කලාපය පුරා තම කඳවුරු පිහිටුවා ගැනීමේ අයිතිවාසිකම් ආක්‍රමණශීලී ලෙස අත්කර ගනිමින් ද, කැරිබියන් සහ පැසිෆික් කලාපයේ නාවික මෙහෙයුම් පුළුල් කරමින් ද සිටී. මත්ද්‍රව්‍ය ජාවාරම පිළිබඳ සාක්ෂි නොමැතිව චෝදනා කරනු ලැබූ ධීවරයින් 157 දෙනෙකුගේ ජීවිත බිලිගත් දැනුදු කෙරීගෙන යන අඛණ්ඩ බෝම්බ හෙලීමේ ව්‍යාපාරයක් ද ඊට ඇතුළත් ය.

ට්‍රම්ප්ගේ භාණ්ඩාගාර ලේකම්වරයා ආර්ජන්ටිනාව කලාපයේ ඇමරිකානු මුලෝපායික මාර්ගයේ "කේන්ද්‍රස්ථානය" ලෙස ප්‍රකාශ කිරීමත් සමඟ, හාවියර් මිලී, චීන ධීවර මෙහෙයුම්වලට එරෙහි වීමේ මුවාවෙන් දකුණු අත්ලාන්තික් සාගරයේ පාලනය පෙන්ටගනයට පවරා දී, වසර 100 කට වැඩි කාලයක් තිස්සේ කම්කරුවන්ගේ ජයග්‍රහණ මකා දැමීම අරමුණු කරගත් කම්කරු "ප්‍රතිසංස්කරණයක්" ක්‍රියාත්මක කර, එක්සත් ජනපද පිටුබලය ලත් අවසන් මිලිටරි ආඥාදායකත්වයේ අපරාධ ආරක්ෂා කර ඇත.



මතන්සාස්, කියුබාව [ඡායාරූපය Greg0611 / CC BY 4.0]

පැනමා ඇළ සහ ග්‍රීන්ලන්තය මිලිටරිමය වශයෙන් අත්පත් කර ගන්නා බවට ට්‍රම්ප් නැවත නැවතත් තර්ජනය කර ඇති අතර, මෙක්සිකෝව ආක්‍රමණය කර බෝම්බ හෙලීම සඳහා නිතර කැඳවුම් කරයි.

වෙනිසියුලාව යටත් කරගත් භූමියක් ලෙස සලකමින්, කැනඩාව පිළිබඳ ඒ හා සමාන ප්‍රකාශයන් අනුගමනය කරමින්, ට්‍රම්ප් මෑතකදී සමාජ මාධ්‍ය ඔස්සේ යෝජනා කළේ, වෙනිසියුලාව එක්සත් ජනපදයේ 51 වන රාජ්‍යය බවට පත්විය හැකි බවයි. කැරකස් හි බෝම්බ හෙලීමේ ව්‍යාපාරයක් අතරතුර ජනාධිපති නිකොලස් මදුරෝ සහ ඔහුගේ බිරිඳ පැහැර ගැනීම, සීඅයිඒ සංවිධානයට රට විවෘත කර ඇති අතර, එහි තෙල් හා ඛනිජ සම්පත් කොල්ලකෑම සඳහා සංගතවලට විවෘත කර තිබේ.

ආර්ජන්ටිනා, හොන්ඩුරාස් සහ කොස්ටාරිකාවේ අන්ත දක්ෂිණාංශික අපේක්ෂකයින් සඳහා සිදුකල සමාන ආකාරයේ බලහත්කාරී අනුමත කිරීම්වලින් පසුව, මිලීගේ ප්‍රතිපත්ති අනුගමනය කරමින් ආර්ථික කම්පන-චිකිත්සක (shock therapy) වැඩසටහනක් දැනටමත් දියත් කරමින් සිටින, ඔගස්ටෝ පිනෝචෙට් ඒකාධිපතිත්වයේ විවෘත රසිකයෙකු වන හොසෙ ඇන්ටෝනියෝ කස්ට්ගේ චිලී මැතිවරණ ව්‍යාපාරයට ට්‍රම්ප් සහාය දැක්වීය.

**මෙය හුදෙක් භූ දේශපාලනය නොවේ; එය පන්ති යුද්ධය යි. 20 වන සියවස පුරා මුළු ඇමරිකානු කලාපයේම කම්කරුවන් දිනා ගන්නා ලද සමාජ හා ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණ අතුගා දැමීම මෙහි අරමුණයි. එය පසුගිය සියවසේ මිලිටරි ඒකාධිපතිත්වයන් විසින් උත්සාහ කරන ලද සමාජ ප්‍රතිවිප්ලවය**

**සම්පූර්ණ කිරීමකි. මෙය දේශීයව ෆැසිස්ට් තන්ත්‍රයක් ගොඩනැගීමට ට්‍රම්ප් දරන උත්සාහයන්ගෙන් වෙන් කළ නොහැකිය.**

**කියුබාවට සාමූහිකව දඬුවම් කිරීම**

දිවයිනට එකදු මිසයිලයක් වත් එල්ල නොකර වුවද, කියුබාවේ ආර්ථික ගෙල සිර කිරීම මගින් සිදු කරන විනාශයේ පරිමාණය යුද්ධයේ විනාශයට සමාන වේ. 2026 මුල් භාගයේදී මදුරෝ ඉවත් කිරීමෙන් පසුව, එක්සත් ජනපදය විසින් කියුබාව වෙනිසියුලානු තෙල් නැව්ගත කිරීම් කපා හැර ඇති අතර කියුබාවට ඉන්ධන අපනයනය කළහොත් මෙක්සිකෝව සහ අනෙකුත් සැපයුම්කරුවන්ට ආර්ථික අඩපණ කෙරෙන තීරුබදු පැනවීමට තර්ජනය කළේය. මෙක්සිකෝවේ ජනාධිපති ක්ලෝඩියා ෂයින්බෝම් ජනවාරි මාසයේදී තෙල් නැව්ගත කිරීම් නැවැත්වූවාය. "වාම" නායකයින් සහ ප්‍රධාන තෙල් අපනයනකරුවන් විසින් පාලනය කරනු ලබන බ්‍රසීලය සහ කොලොම්බියාව ද සම්බාධක බිඳ දැමීම ප්‍රතික්ෂේප කර ඇත.

**මෙය හුදෙක් යටත් වීමක් නොව, අර්ධගෝලය කපා කොටස් කිරීමේ වොෂින්ටනයේ නව යටත් විජිතවාදී ප්‍රතිපත්තියේ කනිෂ්ඨ හවුල්කරුවන් ලෙස තමන්ව ස්ථානගත කිරීමට උත්සාහ කරන දේශීය ධනේශ්වර අවශ්‍යතා ආරක්ෂා කිරීමට සහාය වීමකි.**

කියුබාවේ හුදකලාව තියුණු ය. ඉක්වදෝරය කියුබානු රාජ්‍ය තාන්ත්‍රිකයින් නෙරපා හැරියේය; නිකරගුවාව කියුබානුවන් සඳහා වීසා රහිත ගමන් සීමා කළේය; එසේම, සහ ග්වාතමාලාව, හොන්ඩුරාස් සහ ජැමෙයිකාව, ඩොලර් ඇතුළු ප්‍රධාන විදේශ මුදල් සැපයු වෛද්‍ය සහයෝගීතා ගිවිසුම් අවසන් කිරීමට පියවර ගෙන තිබේ.

බර බොරතෙල් දහනය කරන පැරණි සෝවියට් යුගයේ තාප බලාගාර සහ ඩීසල් ජනක යන්ත්‍ර ජාලයක් මත යැපෙන කියුබානු විදුලිබල ජාලය බිඳවැටීමේ ලක්ෂ්‍යයෙන් ඔබ්බට තල්ලු කර දමා ඇත. මාර්තු 16 වන දින, මුළු ජාතික විදුලිබල පද්ධතියම බිඳ වැටීමෙන් මුලු දිවයිනම අන්ධකාරයට ඇද වැටුණි . ඉන් පැය 29 කට පසුව, විදුලිය අර්ධ වශයෙන් පමණක් යථා තත්ත්වයට පත් කරන ලදී.

මැටන්සාස් හි සේවිකාවක් WSWS වෙත පැවසුවේ ඇගේ අසල්වැසි ප්‍රදේශයේ විදුලිය නොමැතිව දින ගණනක් ගෙවී ගොස් ඇති බවයි. පානීය ජලය සීමිත වුවද, ඉවුම් පිහුම් සඳහා අවශ්‍ය වන ගෑස් සොයා ගැනීමට නැත. සෞඛ්‍ය සේවා පද්ධතියේ බිඳවැටීමේ ප්‍රතිඵලයක් ලෙස දැනටමත් ගණන් කළ නොහැකි ජීවිත ප්‍රමාණයක් අහිමි කරමින් පවතීම නිසා සමීප ඥාතියෙකු මෑතකදී මිය ගිය බව ඇය විස්තර කළාය.

වෛද්‍ය පද්ධතියෙ හි "හදිසි නොවන" ක්‍රියා පටිපාටි 100,000 කට ආසන්න සංඛ්‍යාවක පොරොත්තු ලේඛනයක් ඇති අතර, එයට ළමුන් 11,000 කට වඩා ඇතුළත් වේ. බොහෝ අවස්ථාවලදී, "හදිසි නොවන" යන්නෙහි සරල තේරුම "තවමත් මිය ගොස් නැත" යන්නයි.

බලශක්ති විශ්ලේෂක ජෝර්ජ් පිනෝන් අනතුරු අඟවා ඇත්තේ: "ඉන්ධනවලින් සියයට සියයක්ම අතුරුදහන් වන රටක් මම කිසි දිනෙක දැක හෝ අධ්‍යයනය කර නැත."යනුවෙනි.

මෙම තත්වයන් යටතේ, කුඩා නමුත් සැලකිය යුතු විරෝධතා පැන නැගී ඇත: බිඳ වැටෙන අධ්‍යාපනයට එරෙහිව විශ්ව විද්‍යාල සිසුන් වාඩිලා ගැනීම, කම්කරු පන්ති නිවහන් ප්‍රදේශ වල භාජන වලට ගසමින්, විදුලිය සහ ආහාර ඉල්ලා සිටීම, මෑතකදී විරෝධතාකරුවන් විසින් කොමියුනිස්ට් පක්ෂ කාර්යාලයක ගෘහ භාණ්ඩ ගිනි තැබූ මොරොන්හි ඇති වූ කෝලාහල වැනි දේ සදහන් කල හැක.

**20 වන සියවස අහෝසි කිරීමේ ගාමකයේ පෙරමුණක්**

**කියුබාවට එරෙහි අධිරාජ්‍යවාදී ප්‍රහාරය සුවිශේෂී ලෙස පළිගැනීමේ ස්වභාවයක් ගනී. වොෂින්ටනය හුදෙක් සංගත වල හා මූල්‍ය අවශ්‍යතා පසුපස හඹා යනවා පමණක් නොව, ඇමරිකානු රූකඩ පාලන තන්ත්‍ර පෙරලා දැමූ 1959 කියුබාවේ සහ 1979 ඉරානයේ විප්ලව දෙකකට එරෙහිව එකවර ඓතිහාසික පළිගැනීමේ ව්‍යාපාරයක් දියත් කරමින් සිටී.**

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව අවධාරනය කළ පරිදි, කියුබානු විප්ලවය කම්කරු පන්තියේ සවිඥානික නායකත්වය යටතේ ධනේශ්වර දේපළ සබඳතා සමාජවාදී ලෙස පෙරළා දැමීමක් නියෝජනය කළේ නැත. ඒ වෙනුවට, එක්සත් ජනපද සංගත වල දේපළ අත්පත් කර ගැනීම, ඉඩම් ප්‍රතිසංස්කරණ සහ සෞඛ්‍ය හා අධ්‍යාපනයේ සමාජ පියවර ක්‍රියාවට දැමිණි. ඒවා 20 වන සියවසේ ලොව බොහෝ ප්‍රදේශවල බලයට පත් වූ ධනේශ්වර ජාතිකවාදී සහ යටත් විජිත විරෝධී ව්‍යාපාරවල රැඩිකල් ප්‍රභේදයක් වූ අතර අවසාන විග්‍රහයේදී 1917 රුසියානු විප්ලවයෙන් ආභාෂය ලැබීය.

**අද, ගෝලීය ධනේශ්වර අර්බුදයේ සහ යුද ධාවනයේ කස පහර යටතේ, පාලක පන්ති "20 වන සියවස අහෝසි කිරීමට" අධිෂ්ඨාන කරගෙන සිටී. එනම්, නග්න සූරාකෑම, යටත් විජිතකරණය සහ සීමා නොකළ පොලිස් මිලිටරි පාලනයන් පිහිටුවීම ආදීය මගින් මානව වර්ගයා 19 වන සියවසේ පැවැති තත්වයන්ට නැවත ගෙන ඒමයි.**

ජනවාරි මාසයේ වාර්තාවක එක්සත් ජනපද චින්තන පර්ෂදයක් වන ජේම්ස්ටවුන් පදනම (Jamestown Foundation) සඳහන් කළේ, කියුබාවේ ඇද වැටීම " රුසියාවට, චීනයට හෝ වෙනත් කිසිවෙකුට විකල්ප බල මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට ඇති නොහැකියාව පිළිබඳ අවසාන සාක්ෂියක් ලෙස ගෝලීය දකුණ විසින් සැලකෙනු ඇති " බවයි.

කියුබාවේ දුක්ඛිත තත්ත්වයට, ලතින් ඇමරිකාවේ ඊනියා "රෝස රැල්ලේ" (pink tide) රජයන් හා රුසියාව සහ චීනය දක්වන ප්‍රතිචාරය, ඔවුන්ගේ බංකොලොත්භාවය සහ ඇමරිකානු

අධිරාජ්‍යවාදයට ප්‍රතිවිරුද්ධ බලයක් ලෙස “කලාපීය ඒකාබද්ධතාවයෙ” නැතහොත් BRICS හි වංචාව හෙළිදරව් කරයි.

**නමුත් කියුබාවට එරෙහි දරුණු ප්‍රහාරය සහ ලතින් ඇමරිකාවේ අන්ත දක්ෂිණාංශික පාලන තන්ත්‍රයන්ගේ ප්‍රති-විප්ලවවාදී අක්ෂයක් ගොඩනැගීමට දරන උත්සාහය, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ශක්තියේ සලකුණු නොව එහි ගැඹුරු දුර්වලතාවයේ සලකුණු වේ.**

**කියුබාවේ කටුක වේදනාව, එක්සත් ජනපද ආර්ථික හා මිලිටරි ආධිපත්‍යය මත රැඳුනු 1945 න් පසු ලෝක පර්යායේ පුළුල් බිඳවැටීම සහ බහු ධ්‍රැවීයතාව ඇතුළු වෙනත් කිසිදු ධනේශ්වර පදනමක් මත මෙම පර්යාය ප්‍රතිනිර්මාණය කිරීමේ නොහැකියාව සමඟ බැඳී ඇත.**

### ජාත්‍යන්තර කම්කරු පන්තික ප්‍රහාරයක් දෙසට

කියුබාවේ ගෙල සිර කිරීම, ඊට අනුබල දෙන ධනේශ්වර-ජාතිකවාදී ආණ්ඩුවලට ආයාචනා කිරීමෙන් නැවැත්විය නොහැකි නම්, එයට විරුද්ධ විය හැක්කේ කුමන සමාජ පදනමක් මතද?

පිළිතුර පවතින්නේ ජාත්‍යන්තර කම්කරු පන්තිය සතුවය. කියුබාව වටලෑම එක්සත් ජනපදය ඇතුළු සෑම තැනකම කම්කරුවන්ට එල්ල කරන ප්‍රහාරයෙන් වෙන් කළ නොහැකි ය. ඉරානයට එරෙහි සාපරාධී යුද්ධයෙන් මෙහෙයවනු ලබන තෙල් මිල ඉහළ යාම දැනටමත් උද්ධමනයට සහ කප්පාදුවලට ඉන්ධන සපයන අතර එය 1970 ගණන්වල සිදුවීම් සිහිපත් කරයි. එහි දී ඇති වූ තෙල් කම්පන මගින් ලතින් ඇමරිකාව සහ ඉන් ඔබ්බට දැවැන්ත පන්ති අරගල පුපුරුවා හැරියේය.

කියුබාවට සිදු කරනු ලබන වධහිංසාවට එරෙහිව පන්ති ප්‍රතිචාරය අධිරාජ්‍යවාදී යුද්ධයට සහ සමාජ ප්‍රතිවිප්ලවයට එරෙහි පුළුල් අරගලයක කොටසක් ලෙස සංවිධානය කළ යුතුය. **කියුබානු කම්කරු පන්තියේ සාගින්න අවසන් කිරීම සඳහා එක්සත් ජනපදය, කැනඩාව, ලතින් ඇමරිකාව ඇතුළු ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් සම්බාධක සහ සියලු අවහිර කිරීම් වහාම සහ කොන්දේසි විරහිතව අවසන් කරන ලෙස ඉල්ලා සිටිය යුතු අතර එමගින් එයට (කම්කරු පන්තියට) තමන්ගේ පාලක ප්‍රභූව සමඟ ගණුදෙනු බේරා ගැනීමට ඉඩ සැලැසෙනු ඇත.**

කියුබාව සුරැකීම ස්ටැලින්වාදී සහ ව්‍යාජ වාම සංවිධාන විසින් දිගු කලක් තිස්සේ ඔසවා ආරක්ෂා කරන ලද අර්ථයෙන් “ජාතික” ප්‍රශ්නයක් නොවේ.

ඩේවිඩ් නෝර්ත් ඔහුගේ 1993 “නොනවතින විප්ලවය සහ අද දින ජාතික ප්‍රශ්නය” දේශනයේදී පැහැදිලි කළ පරිදි, අධිරාජ්‍යවාදය “ජාතික රාජ්‍යයේම මළ බෙරය වැයූ බව” ට්‍රොට්ස්කි පෙන්වා දුන්නේය. එපමණක් නොව, “අධිරාජ්‍යවාදයේ යුගයේ දී, ජාතික පදනමක් මත මානව වර්ගයාගේ කිසිදු මූලික ගැටලුවක් විසඳීමේ නොහැකියාව”, ස්වදේශික ධනේශ්වර නායකත්වයක් යටතේ “ජාතික විමුක්තිය” පිළිබඳ ඉදිරිදර්ශනය ප්‍රතිගාමී යුතෝපියාවක් බවට පත් කර ඇත. කැස්ත්‍රෝ සහ අසංඛ්‍ය සංඛ්‍යාත “ජාතික විමුක්ති” සංකේතවල වාර්තාව මෙය සනාථ කර ඇත: ඔවුන් සියල්ල ජාතික-රාජ්‍ය රාමුවක් මත රඳා පැවතුනි; අධිරාජ්‍යවාදය සහ ස්ටැලින්වාදය අතර සමතුලිතතාවය සඳහා උත්සාහ කළ අතර, ඔවුන්ගේ මතුපිට ජයග්‍රහණ බිඳ වැටුණු විට ඒ සඳහා මිල ගෙවීම කම්කරු පන්තිය මත පැටවුනි.

කියුබාවේ සහ වෙනිසියුලාවේ රජයන් සමඟ “රෝස රැල්ලේ” ඉතිරි රටවල් වල වත්මන් යටත් වීමේ රැල්ල, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය නිශේධනීය ලෙස සනාථ කරයි: එනම්, **අධිරාජ්‍යවාදී යුගයේ දී, පීඩිත රටවල් මුහුණ දෙන මූලික ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජීය කාර්යයන් කිසිවක්, ධනේශ්වර හෝ සුලු ධනේශ්වර නායකත්වයන් යටතේ ජාතික පදනමක් මත විසඳා ගත නොහැක.** කියුබාව ආරක්ෂා කිරීම සඳහා සහ 20 වන සියවසේ කම්කරුවන් විසින් දිනා ගන්නා ලද සියලු ජයග්‍රහණ ආරක්ෂා කිරීම සඳහා ඇති ඇති එකම ශක්‍ය පදනම නම්, ලෝක සමාජවාදී විප්ලවයේ කොටසක් ලෙස බලය සඳහා කම්කරු පන්තිය ස්වාධීනව, ජාත්‍යන්තරව බලමුලු ගැන්වීමයි.


මෙහි තේරුම නම්, ඉදිරියේදී ඇතිවන පන්ති අරගලයට අවශ්‍ය දැනුවත් සමාජවාදී නායකත්වය ලබා දීම සඳහා කියුබාව තුළ සහ ලතින් ඇමරිකාව පුරා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ කොටස් ලෙස සැබෑ විප්ලවවාදී පක්ෂ ගොඩනැගීමයි.

(අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි)

---








Mehring Books

**මෙම පොත් Mehring Books වෙතින් ඇනවුම් කරන්න.**

 ISSN 3093-6217

# මාර්තු 28 “රජවරු එපා” පෙළපාලි: දේශපාලන පාඩම්

**ජෝසප් කිෂෝර්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* මාර්තු *29* වන දින ***‘The March 28 “No Kings” demonstrations: The political lessons’***යන හිසින් පළවූ ඇන්ඩ්‍රෙ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

මාර්තු 28 වන දින පැවති ” නෝ කිංග්ස් ” පෙළපාලිවල තුන්වන වටය, ඇමරිකානු ඉතිහාසයේ විශාලතම එක්දින විරෝධතාව වූ අතර, එය එක්සත් ජනපදය පුරා මිලියන සංඛ්‍යාත ජනතාවක් වීදිවලට ඇද ගන්නා ලදී. ජනපද 50 පුරා සෑම ප්‍රධාන නගරයකම මෙන්ම කුඩා නගර සිය ගණනක විරෝධතා 3,300 කට වැඩි ගණනක් ඇති විය. දළ වශයෙන් මිලියන 8 ක ජනතාවක් ඒවාට සහභාගී වූ බව සංවිධායකයින් ගණන් බලා තිබේ.

එක් එක් විරෝධතාවල පරිමාණය අසාමාන්‍ය විය: ජාතිකව ප්‍රමුඛතම රැස්වීම ලෙස නම් කරන ලද මිනියාපොලිස්–ශාන්ත පාවුහි, රාජ්‍ය කැපිටල් ක්‍රීඩාංගණයට 100,000 ත් 200,000 ත් අතර පිරිසක් ඇදී ආහ. නිව්යෝර්ක් නගරයේ ඇස්තමේන්තුගත සහභාගිත්වය 350,000 ක් විය; බොස්ටන්හි 180,000 කි (අපේක්ෂා කළ ප්‍රමාණය මෙන් දෙගුණයක්); චිකාගෝහි 200,000 ක් විය; සියැටල්හි 90,000 ක් සහ සැන් ඩියාගෝහි 40,000 ක් ඇතුළුව රට පුරා ප්‍රධාන නාගරික මධ්‍යස්ථානවල විශාල විරෝධතා වාර්තා විය. සංවිධායකයින් ප්‍රකාශ කළේ, ජාතික විරෝධයේ පළල අවධාරණය කරමින්, ප්‍රධාන වශයෙන් ග්‍රාමීය, රිපබ්ලිකන්-නැඹුරු ප්‍රජාවන් තුළ. විරෝධතා 600 ක් පමණ සිදු වූ බවයි

**මාර්තු 28 වන දින විරෝධතාවල පරිමාණය, රට තුළ ඒකාධිපතිත්වයේ වර්ධනය සහ විදේශයන්හි අධිරාජ්‍යවාදී යුද්ධයේ උත්සන්න වීම කෙරෙහි මහජන කෝපයේ ගැඹුර පිළිබිඹු කළේය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවලින් බිඳී යන ධනේශ්වර කතිපයාධිකාරය සහ ජනගහනයේ පුලුල් ජනතාව අතර ගැටුමක් දිග හැරෙමින් තිබේ.**

දැන් මාසයක් පැරණි ඉරානයට එරෙහි යුද්ධය, රැළි වලට සහභාගී වූවන්ට තීරණාත්මක උද්වේගකර බලවේගයක් විය. විරෝධතා කැඳවූ සංවිධාන විසින් එය අවතක්සේරු කරන ලද නමුත්, නගරයෙන් නගරයට සංකේත සහ ගායනා මගින් විරෝධය ප්‍රකාශ විය. පෙලපාලි පැවැත්වෙන අතරතුර, ට්‍රම්ප් විසින් ලෝකයට විනාශකාරී ප්‍රතිවිපාක සහිත තවත් මිලිටරි උත්සන්න කිරීමක් සූදානම් කරමින් සිටියේය. විරෝධතාවලට පසු දින, වොෂින්ටන් පෝස්ට් වාර්තා කළේ පෙන්ටගනය ඉරානයේ “සති හෝ මාස කිහිපයක” ගොඩබිම් මෙහෙයුම් සඳහා සූදානම් වෙමින් සිටින බවත්, වංචාකාරී




2026 මාර්තු 28 වන දින නිව්යෝර්ක් නගරයේ පැවති දැවැන්ත “නෝ කිංග්ස්” රැලියේ කොටසක්.

සාකච්ඡා කඩතුරාව මධ්‍යයේ එවැනි මෙහෙයුම් සඳහා සැලසුම් කිරීම "සති ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පවතින" බවත්ය.

විරුද්ධවයේ පරිමාණය පාලක පන්තිය භීතියට පත් කරන අතර, සංගත මාධ්‍යවල ප්‍රතිචාරය වූයේ එය අවතක්සේරු කර හැකි ඉක්මනින් ඉදිරියට යාමයි. නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත එහි කෙටි වාර්තාවේ දී සඳහන් කලේ, විරෝධතා පෙළපාලි සංවිධානය වූයේ යුද්ධයට සහ ආඥාදායකත්වයට එරෙහි දැවැන්ත විරෝධතා පිපිරීමක් ලෙස නොව, "කලකිරීමට පත් ඩිමොක්‍රටික් පාක්ෂිකයින්" සහ මධ්‍ය-වාර මැතිවරණ උපාමාරු සඳහා වාහකයක් ලෙස යනුවෙනි. ඊට පසු දින ඉරිදා කේබල් ප්‍රවෘත්ති වැඩසටහන් ඇමරිකානු ඉතිහාසයේ විශාලතම විරෝධතාව ගැන සඳහන් කළේ යන්තමිනි.

**මුහුණ දිය යුතු ප්‍රශ්නය නම්: විරුද්ධත්වයේ පරිමාණය සැලකිල්ලට ගත් විට, ට්‍රම්ප් තවමත් බලයේ සිටින්නේ කෙසේද? යන්නයි. ව්‍යවස්ථාව විවෘතව උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන, ඒකාධිපතිත්වයක් ගොඩනඟන සහ ලෝක ජනගහනය නීති විරෝධී ආක්‍රමණශීලී යුද්ධයකට ඇද දමන අපරාධකාරී තන්ත්‍රයකට පාලනය දිගටම කරගෙන යා හැක්කේ කෙසේද?**

පිළිතුර පවතින්නේ මිලියන ගණනකගේ කෝපය සහ විරෝධතා කැළඹූ විපක්ෂ යැයි කියනු ලබන ඩිමොක්‍රටික් පක්ෂයට සම්බන්ධ කණ්ඩායම් (Indivisible මගින් මෙහෙයවනු ලබන) අතර දේශපාලන පරතරය තුළ ය. යුද්ධය නිතාමතාම අවතක්සේරු කිරීමේදී මෙය වඩාත් තියුණු ලෙස ප්‍රකාශ විය.

**ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මණ්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත්ට ප්‍රමනියේ නියුරම්බර්ග් හි පැවති "නෝ කිංස් " රැලිය ඇමතීමෙන් වලකන ලදී. ඩිමොක්‍රටික් පක්ෂ ක්‍රියාකාරීන් "ඩිමොක්‍රටික් පක්ෂය සහාය දෙන ඉරානයට එරෙහි නීති විරෝධී යුද්ධයට එරෙහිව කතා කිරීමට සහ එය හෙළා දැකීමට මට ඉඩ නොදෙනු ඇත" යනුවෙන් නෝර්ත් සඳහන් කළේය.**

ප්‍රධාන රැලිවලදී, ඩිමොක්‍රටික් දේශපාලනඥයන් යුද්ධය සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම හෝ එය අමතර වාක්‍ය ඛණ්ඩයකට ඌනනය කරන ලදී. මන්ද ඔවුන් යුද්ධයේ මූලික අරමුණු සමඟ එකඟ වන අතර එහි මූලික නිර්නායකයන් පිළිගන්නා බැවිනි. බොස්ටන්හිදී, සෙනෙට් සභික එලිසබෙත් වොරන් "ඉරානය" ගැන කිසිසේත් සඳහන් නොකළ අතර, ට්‍රම්ප් "ලොව පුරා අඩක් බෝම්බ හෙළීමට දිනකට ඩොලර් බිලියනයක් වියදම් කිරීම" පිළිබඳ කෙටි සඳහනක් පමණක් ඇතුළත් කලාය.සෙනෙට් සභික එඩ් මාර්කි යුද්ධය ගැන සඳහන් කළේ වැදගැම්මකට නැති වාක්‍ය ඛණ්ඩයක් මගිනි.

මිනසෝටා හි දී බර්නි සැන්ඩර්ස්ගේ විවෙචන ප්‍රධාන ඩිමොක්‍රටික් පක්ෂ චරිතයක් විසින් යුද්ධය සඳහා වාක්‍යයකට වඩා කැප කරන ලද එකම අදහස් දැක්වීමයි. "ඉරානයේ යුද්ධය ගැන අද අපට බොරු කියනු ලැබේ," සැන්ඩර්ස් ප්‍රකාශ කළේය. "ට්‍රම්ප් සහ ඔහුගේ සහකරු වන ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු ඉරානය සමඟ යුද්ධයක් ආරම්භ කළ අතර එය "ව්‍යවස්ථා විරෝධී" බව ඔහු පැවසීය, මන්ද "ට්‍රම්ප් කොංග්‍රසයෙන් අවසර ලබා ගැනීමට උත්සුක නොවීම හෝ අවසරය ලබා නොගත්" බැවිනි. යුද්ධය "ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක්" බව සැන්ඩර්ස් තවදුරටත් පැවසීය.

නමුත් සැන්ඩර්ස්ගේ කාර්යය වන්නේ යුද්ධයට සහ ඒකාධිපතිත්වයට එරෙහි විරෝධය වර්ධනය කිරීම නොව එය වැළැක්වීමයි. **ඔහු යුද්ධය ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පන්ති අවශ්‍යතා සහ දශක ගණනාවක් තිස්සේ අනුගමනය කරන ලද ද්විපාර්ශ්වික ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් ලෙස නොව, ට්‍රම්ප් සහ නෙතන්යාහුගේ නිෂ්පාදනයක් ලෙසය. ගාසා තීරයේ ජන සංහාරය ගැන ඔහු සඳහන් කළ අතර එය ආරම්භ කර සන්නද්ධ කරන ලද්දේ ඩිමොක්‍රටික් පක්ෂය සහ සැන්ඩර්ස් විසින් සහාය දුන් බයිඩන් යටතේ බවය යන්න ගැන කිසිවක් නොකීවේය. ට්‍රම්ප්ගේ යුද යන්ත්‍රයට අරමුදල් සැපයීමට ඩිමොක්‍රටිකයින් නැවත නැවතත් ඡන්දය දී ඇති බව ගැන ද ඔහු සඳහන් කළේ නැත.**

"කොන්සර්වේටිව්වරුන්, මධ්‍යස්ථවාදීන් සහ ප්‍රගතිශීලීන්" යුද්ධය අවසන් කිරීම සඳහා "එකාවන්ව" කතා කරන බවට කරන ලද ප්‍රකාශයෙන් සැන්ඩර්ස්ගේ භූමිකාව සාරාංශගත කළ හැක. එය, ස්වාධීන බලවේගයක් ලෙස කම්කරු පන්තියට නොව, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ කොල්ලකාරී අරමුණු ස්පර්ශ නොකර තබමින්, ගැටුම "ඊශ්‍රායලයේ යුද්ධය" ලෙස ඉදිරිපත් කරමින් විවේචනය කරන දක්ෂිණාංශික කොටස් සහ රිපබ්ලිකන් පක්ෂයට නැඹුරු වීම සඳහා කරන ආයාචනයකි. සැන්ඩර්ස් ඇත්ත වශයෙන්ම යෝජනා කරන්නේ කුමක්ද? මැතිවරණ උපාමාරු සහ නොවැම්බර් මාසයේ දී ඩිමොක්‍රටිකයන්ට ඡන්දය දීමය.

විරෝධතාවලට මිලියන සංඛ්‍යාත කම්කරුවන් සහභාගී වූ නමුත් ඔවුන් එසේ කළේ සංවිධානාත්මක බලවේගයක් ලෙස නොව පුද්ගලයන් ලෙස ය. ස්වාධීන කම්කරු පන්ති ක්‍රියාමාර්ග මර්දනය කිරීමේදී, කම්කරුවන් ඩිමොක්‍රටික් පක්ෂයට බැඳ තැබීමේදී සහ ට්‍රම්ප්ගේ වැඩසටහනට අනුගත (adapt) වීමේදී වෘත්තීය සමිති නිලධරයේ කාර්යභාරය මෙයින් ප්‍රකාශ වේ. ෂෝන් ෆේන් යටතේ එක්සත් මෝටර් රථ කම්කරු සමිතිය (UAW) ට්‍රම්ප්ගේ "පළමුව ඇමරිකාව" යන කෝකටත් තෛලය ප්‍රවර්ධනය කර ඇති අතර ඩෙට්‍රොයිට් හි සාපේක්ෂව කුඩා සහභාගීත්වය මගින් මෙය විශේෂයෙන් පැහැදිලි විය.

මිනසෝටා රැලියේ AFL-CIO සභාපති ලිස් ෂූලර් සහ ඇමරිකානු ගුරු සම්මේලනයේ සභාපති රැන්ඩි වෙයින්ගාර්ටන් දේශන පැවැත් වූහ. ෂූලර් කිසි විටෙකත් යුද්ධය ගැන සඳහන් නොකළේය. ඉරානය ගැන සඳහන් නොකර, "එය දිනකට ඩොලර් බිලියනයක් වැය වන" බව

වෙයින්ගාර්ටන් සඳහන් කළාය. යුක්රේනයේ යුද්ධයේ උද්යෝගිමත් ආධාරකරුවෙකු වන වෙයින්ගාර්ටන්, මෙම මුදල් රුසියාවට එරෙහි යුද්ධය සඳහා වියදම් කිරීමට කැමති වනු ඇති බවට සැකයක් නැත.

රට පුරා වර්ධනය වන වැඩ වර්ජන ව්‍යාපාරය ගැන ෂූලර් හෝ වෙයින්ගාර්ටන් සඳහන් කළේ නැත. තීරණාත්මක **කර්මාන්ත හා සේවාවල කම්කරුවන්** අරගලයට අවතීර්ණ වන මොහොතේම, "මිලියන 15 ක කම්කරුවන්" වෙනුවෙන් කතා කරන බව පවසන නිලධාරීන්–වෙයින්ගාර්ටන් පැවසූ පරිදි, "අද රජවරු එපා, අපි නොවැම්බර් මාසයේදී ඡන්දය දෙමු," ලෙස– ඩිමොක්‍රටික් පක්ෂයට ඡන්දය දීම හැර, ට්‍රම්ප් පරිපාලනයට හෝ "කෝටිපතියන්ට" විරුද්ධ වීමට කම්කරුවන් සැබවින්ම කිසිවක් කළ යුතු යැයි යෝජනා කළේ නැත.

**මාර්තු 28 වන දින පැවති විරෝධතා ට්‍රම්ප් පරිපාලනයට ගැඹුරු සහ පුලුල්ව පැතිරුනු විරෝධයක් ප්‍රකාශ කළ නමුත් මෙම විරෝධය තවමත් පැහැදිලි දේශපාලන වැඩසටහනකින් මෙහෙයවනු නොලැබේ. කේන්ද්‍රීය කර්තව්‍යය වන්නේ අර්බුදයේ පරිමාණයට සමාන සවිඥානික ඉදිරිදර්ශනයකින් එය සන්නද්ධ කිරීමයි. ඇතැම් මූලික කරුණු අවධාරණය කළ යුතුය.**

**පළමුව**, ට්‍රම්ප් පරිපාලනය විදේශයන්හි යුද්ධය උත්සන්න කිරීම සහ රට තුළ ඒකාධිපතිත්වය සඳහා කුමන්ත්‍රණය කිරීම සමඟ එකවර ඉදිරියට යමින් සිටී. මහජන විරෝධයට එහි ප්‍රතිචාරය වන්නේ සහන නොව මර්දනය තීව්‍ර කිරීමයි. එනම් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මකා දැමීම, පොලිස්-රාජ්‍ය ක්‍රම සාමාන්‍යකරණය කිරීම සහ විසම්මුතිය නිහඬ කිරීම සඳහා වඩ වඩාත් ප්‍රචණ්ඩකාරී පියවර සකස් කිරීමයි. **ගුවන් තොටුපළවල ICE නියෝජිතයන් යෙදවීම රට පුරා පැරාමිලිටරි යෙදවීම් සඳහා අත්හදා බැලීමකි.** ඉරිදා "දේශසීමා සාර්වරයා" ("Border Czar") ලෙස ට්‍රම්ප් හඳුන්වන ටොම් හෝමන් ප්‍රකාශ කළ පරිදි ප්‍රවාහන ආරක්ෂක පරිපාලන (TSA) නියෝජිතයින්ට වැටුප් ලැබීම ආරම්භ කළ පසුව පවා, ගුවන් තොටුපල වල මෙම ICE නියෝජිතයින් යොදවනු ඇත.

**දෙවනුව**, ට්‍රම්ප්ගේ ක්‍රියාවන් හුදෙක් ඔහුගේ පෞද්ගලික දුෂ්චරිතයෙන් පැන නගින්නේ නැත. ඔහු කතා කරන්නේ සහ ක්‍රියා කරන්නේ තම ධනය සහ ගෝලීය අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සඳහා නීත්‍යානුකූල භාවයෙන් සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවලින් බිඳී යන ධනේශ්වර කතිපයාධිකාරය නම් පන්තියක නියෝජිතයා ලෙස ය.

**තෙවනුව**, ඩිමොක්‍රටික් පක්ෂය නියෝජනය කරන්නේ ද එම පන්තියමයි. එය ට්‍රම්ප්ගෙන් වෙනස් වන්නේ උපක්‍රම සහ ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් පමණක් වන අතර, යුද්ධයට ඉඩ සලසමින් සහ ධනේශ්වර පාලනයේ අත්තිවාරම් වලට තර්ජනයක් නොවන මැතිවරණ ආදී ආවෘත අන්තයන් සහ ආරක්ෂිත මාර්ග වෙත විරුද්ධත්වය හරවා යැවීමට ක්‍රමානුකූලව කටයුතු කරයි.

**සිව්වනුව**, බලමුලු ගැන්විය යුතු තීරණාත්මක සමාජ බලවේගය වන්නේ වෘත්තීය සමිති උපකරණයෙන් ස්වාධීනව සංවිධානය වූ කම්කරු පන්තියයි. **විරෝධතා, පන්ති අරගලයේ ගැඹුරු වන පිපිරීමක් සමඟ සමපාත වේ.** නමුත් මෙම ව්‍යාපාරය, සංස්ථා සහ රාජ්‍යයට බද්ධ වූ වෘත්තීය සමිති නිලධරයක් විසින් අවහිර කර විසුරුවා හරිනු ලැබේ.

සමාජවාදී සමානතා පක්ෂය එක්සත් ජනපදය පුරා සහ ජාත්‍යන්තරව පැවති විරෝධතාවලට මැදිහත් වූයේ මෙම පදනම මත ය: එනම්, මහජන කෝපය යුද්ධය නැවැත්වීමට සහ ආඥාදායකත්වය පරාජය කිරීමට සමත් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය මූලෝපාය ඉදිරියට ගෙන යාම සඳහාය.

අත්‍යවශ්‍ය ඊළඟ පියවර වන්නේ සේවා ස්ථානවල මුල් බැසගත් ස්වාධීන ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම සහ එකම ධනේශ්වර කතිපයාධිකාරීන්ට සහ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව එක්සත් ජනපදයේ කම්කරුවන් ජාත්‍යන්තර කම්කරුවන් සමග එක්සත් කිරීමයි. යුද යන්ත්‍රයට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට පහරදීමට එරෙහිව සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග සූදානම් කිරීම සඳහා වැඩබිම් සහ දේශසීමා හරහා මෙම කමිටු ගොඩනැගීමට සහ සම්බන්ධ කිරීමට ක්‍රියාකාරී කමිටුවල ජාත්‍යන්තර කම්කරු සන්ධානය (IWA-RFC) දිරිමත් කරයි.

**යුද්ධයට හා ආඥාදායකත්වයට එරෙහි සටන සමාජවාදය සඳහා සටනෙන් වෙන් කළ නොහැකි බව සසප අවධාරනය කරයි. මිලියන ගණනක් වීදිවලට ඇද දමා ඇති තත්වයන් දේශපාලන සංස්ථාපිතයට ආයාචනා කිරීමෙන් නොව, කම්කරු පන්තියේ මහජන සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කිරීමෙන් පමණක් විසඳනු ඇත.**

මෙය ඉල්ලා සිටින්නේ හදිසි කර්තව්‍යයක් ලෙස කතිපයාධිකාරයේ පාලනය අවසන් කිරීමට සහ පෞද්ගලික ලාභය සඳහා නොව මානව අවශ්‍යතා මත සමාජය ප්‍රතිසංවිධානය කිරීමට සමත් නායකත්වයක් ගොඩනැඟීමයි. ඉදිරි මාවතක් සොයන සියලුම කම්කරුවන්ගෙන් සහ තරුණයන්ගෙන් සමාජවාදී සමානතා පක්ෂය (එ.ජ) ඉල්ලා සිටින්නේ සසපට බැඳී මෙම අරගලය භාර ගන්නා ලෙසයි.

(අවධාරණය පරිවර්තනයේදී එක් කරන ලදී)

---

**The Socialist World YouTube Podcast**



Socialism AI
by the WSWS
Ask a question
SocialismAI.com

මාක්ස්වාදය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම

Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**Socialism AI හි සාමාජික වී එය ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.**

**2026 දී සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය.  එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්ථනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න, එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/ මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය **theSocialist.lk** නිති පතා කියවන්න. **The Socialist World** YouTube නාලිකාවේ විවරණ අසන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය දිනපතා කියවන්න: wsws.org. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි

**ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

විප්ලවවාදී නායකත්වය ලෙස සසප ගොඩ නගන්න! SLLA හා එක්වන්න!

World Socialist Web Site **WSWS.ORG**

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න